# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## இலங்கை மரமுந்திரிகை கூட்டுத்தாபனம்

# SRI LANKA CASHEW CORPORATION

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## வருடாந்த கணக்கும் அறிக்கையும்

## ANNUAL REPORT AND ACCOUNTS

## 2016

| පටුන | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිවරයාගේ වාර්තාව<br>• සංස්ථාවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ පරමාර්ථ<br>• අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි හැඳින්වීම | 01-20 |
| 2. | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 21-25 |
| 3. | විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 26-28 |
| 4. | කාර්ය සාධාන වාර්තාව | 29-31 |
| 5. | කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපෙක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග | 32-37 |
| 6. | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | 38-54 |
| 7. | 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව | 55-69 |
| 8. | විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග | 70-82 |
| 9. | වර්ෂ 5 ක ගිණුම් සාරාංශය | 83 |

`

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016 වර්ෂය සඳහා සභාපතිගේ වාර්තාව

**(01)** <u>ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපනය</u>

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25 වන දින අංක 60/ 7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී. සංස්ථාව ආරම්භයේ සිට රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, කජු කර්මාන්තය සඳහා සියළුම සේවාවන් සැපයීම සිදුකරන අතරතුර වාණිජ කටයුතුද ලාභදායි මට්ටමකින් සිදුකරයි.

- **දැක්ම**

ඉතාමත් උසස් තත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුලින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

- **මෙහෙවර**

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාල පාර්ශවයන් වෙත වෘත්තියමය මග පෙන්වීම ලබාදීම තුලින් දිගුකාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ලඟාකර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නගාසිටුවීම.



`

ඉලක්ක

- වගාව ව්‍යාප්ත කිරීම මගින් අස්වැන්න ඉහළ නැංවීම
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිලිගත් වෙළඳනාමයක් ඇතිකිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය
- කජු අපනයනය දිරිගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත්වීම.
- ලාභ ඉපයිම මගින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්වීම.

අරමුණු

**(අ)** කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

**(ආ)** කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

**(ඇ)** කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ තාක්ෂණික. අළෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

**(ඈ)** කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිෂ්චය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

(ඉ) කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(ඊ) කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

(උ) කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අළෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාරදීම.

(ඌ) කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳ පොලවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතු වලට ආධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

**(02) <u>ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2016</u>**

**(2.1) 2016.01.01 දින සිට 2016.02.23 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| i). | **ඩී.බී. කරුණාරත්න මහතා** | - | **සභාපති** |
| ii). | එම්.ඩබ්.එම්. බණ්ඩාරතිලක මහතා | - | නියෝජ්‍ය සභාපති |
| iii). | ආර්.කේ. ජයලත් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) |
| iv). | එම්.ආර්.එම්.අයි. රීසා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v). | වී. මංචනායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

**(2.2)** **2016.02.24 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| i). | **ඩී.බී. කරුණාරත්න මහතා** | - | **සභාපති** |
| ii). | එම්.ඩබ්.එම්.බණ්ඩාරතිලක මහතා | - | නියෝජ්‍ය සභාපති |
| iii). | ආර්.කේ. ජයලත් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) (2016.04.27 දක්වා) |
| iv). | ඒ.ඒ.ඩී.එස්. අතපත්තු මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත 2016.05.26 සිට) |
| v). | එම්.ආර්.එම්.අයි. රීසා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vi) | වී. මංචනායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vii). | කේ. ලිංගරාජා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| viii) | ඒ.එස්.එම්. ෆස්මි මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

.

2016 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - වී.යු.ලියනගේ මහතා (2016.03.30 දක්වා)
කීර්ති ජයකොඩිආරච්චි මහතා (සාමාන්‍යාධිකාරී) (2016.04.27 දින සිට)

**(2.3)** **ශ්‍රී ලංකා කජු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව - 2016**

| | | | |
|---|---|---|---|
| i). | ආර්.කේ. ජයලත් මහතා | - | කමිටු සභාපති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත (2016.04.28 දක්වා) කමිටු සභාපතිනී |
| ii). | ඒ.ඒ.ඩී.එස් අතපත්තු මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත (2016.06.23 දින සිට) |
| iii). | වී. මංචනායක මහතා | - | කමිටු සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| iv). | එම්.ආර්.එම්.අයි. රීසා මහතා | - | කමිටු සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v). | වී.යු. ලියනගේ මහතා | | කමිටු ලේකම් සහකාර සාමාන්‍යාධිකාරී- |
| | | - | අභ්‍යන්තර විගණන (2016.03.30 දින දක්වා) |



`

| | | | |
|---|---|---|---|
| vi). | ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා | - | කම්ටු ලේකම් සාමාන්‍යාධිකාරී (2016.04.28 දින සිට) |
| vii). | පී.බී. කොඩිකාර මහතා | - | කම්ටු සාමාජික නියෝජ්‍ය සාමාන්‍යාධිකා (2016.09.21 දින දක්වා) |
| viii) | එම්.ටී.එස්.කේ. පීරිස් මහතා | - | කම්ටු සාමාජික සහකාර සාමාන්‍යාධිකාරී - මුදල් (2016.09.21 දින දක්වා) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

**(2.4) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉහල කළමනාකරණය - 2016**

| | | | |
|---|---|---|---|
| i). | ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා | - | සාමාන්‍යාධිකාරී |
| ii). | පී.බී. කොඩිකාර මහතා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |

**(2.5) ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය**

| | | | |
|---|---|---|---|
| i). | එම්.ටී.එස්.කේ. පීරිස් මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී - මුදල් |
| ii). | ජී.බී.බී. සුරේන්ද්‍ර මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාප්ති හා පර්යේෂණ |
| iii). | වී.යු. ලියනගේ මහතා | - | සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර |
| iv). | ආර්.එම්.පී. ජයතිස්ස මහතා | - | විගණන |
| v). | පී.එම්.ඒ.පී.කේ. විජේතුංග මහතා | - | අලෙවි හා පිරිසැකසුම් සහකාර සාමාන්‍යාධිකාරී -වැවිලි |

**(2.6)** <u>ලියාපදිංචි කාර්යාල</u>

**ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල**

**ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය



`

දුරකථන

| | |
|---|---|
| සභාපති | - 0112-871005 |
| නියෝජ්‍ය සභාපති | - 0112-869844 |
| සාමාන්‍යාධිකාරී | - 0112-876134 |
| ෆැක්ස් | - 0112-867843 |
| ඊ මේල් | - cashewco@dialogsl.net |
| වෙබ් අඩවිය | - www.cashew.lk |

**(2.7)** **ප්‍රාදේශීය කාර්යාල, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා පිරිසැකසුම් ඒකක**

| ප්‍රාදේශීය කාර්යාල | ආවරණය වන දිස්ත්‍රික්ක |
|---|---|
| 1. පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය | - පුත්තලම/ කුරුණෑගල |
| 2. හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය | - හම්බන්තොට/ රත්නපුර |
| 3. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය | - අනුරාධපුරය |
| 4. නාලන්ද ප්‍රාදේශීය කාර්යාලය | - මාතලේ/ පොළොොන්නරුව |
| 5. මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය | - මොණරාගල |
| 6. මහියංගණය ප්‍රාදේශීය කාර්යාලය | - මහනුවර/ බදුල්ල |
| 7. අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | - අම්පාර |
| 8. මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය | - මඩකලපුව/ත්‍රිකුණාමලය |
| 9. කිලිනොච්චි ප්‍රාදේශීය කාර්යාලය | - කිලිනොච්චි/ මුලතිව්/ යාපනය |
| 10.මන්නාරම ප්‍රාදේශීය කාර්යාලය | - වවුනියා/මන්නාරම |

**(2.8)**

| වතුයායන් | පිහිටි දිස්ත්‍රික්කය |
|---|---|
| 1. කමන්දළුව වතුයාය | - පුත්තලම |
| 2. පුත්තලම ආච්චිගෙවත්ත වතුයාය | - පුත්තලම |
| 3. එළුවන්කුලම වතුයාය | - පුත්තලම |
| 4. හාඩි වතුයාය | - මඩකලපුව |
| 5. මාන්කර්ණි වතුයාය | - මඩකලපුව |
| 6. කොණ්ඩච්චි වතුයාය | - මන්නාරම- (රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කෙරේ.) |

| | | |
|---|---|---|
| 7. පුනරීන් වතුයාය | - | කිලිනොච්චි- (යුධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලැබේ.) |
| 8. මඩු වතුයාය | - | මන්නාරම- (වගා පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිතය) |
| 9. ඔයාමඩුව වතුයාය | - | අනුරාධපුරය |

(2.9) <u>බීජ උද්‍යාන</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | |
|---|---|---|
| 1. විලච්චිය බීජ උද්‍යානය | - | අනුරාධපුරය |
| 2. නාලන්ද බීජ උද්‍යානය | - | මාතලේ |
| 3. මහඔය බීජ උද්‍යානය | - | අම්පාර |
| 4. සුදුවතුර ආර බීජ උද්‍යානය | - | මොණරාගල |

**(2.10)** <u>මධ්‍යම පැළ තවාන්</u> <u>ආවරණය වන දිස්ත්‍රික්ක</u>

| | | |
|---|---|---|
| 1. මිහින්තලේ පැළ තවාන | - | අනුරාධපුර, වව්නියා, මන්නාරම, කිලිනොච්චි, මුලතිව් |
| 2. දඹුල්ල පැළ තවාන | - | මාතලේ, පොළොන්නරුව |
| 3. කමන්දළුව පැළ තවාන | - | පුත්තලම, කුරුණෑගල |
| 4. හාඩි පැළ තවාන | - | මඩකලපුව/ ත්‍රිකුණාමලය |
| 5. කුඹුක්කන පැළ තවාන | - | මොණරාගල |
| 6. අළුත්තරම පැළ තවාන | - | බදුල්ල/ මහනුවර |
| 7. චන්ද්‍රිකාවැව පැළ තවාන | - | හම්බන්තොට/ රත්නපුර |

**(2.11)** <u>කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | |
|---|---|---|
| 1. නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය | - | ගම්පහ |
| 2. පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය | - | පුත්තලම |

**(2.12)** <u>පර්යේෂණ ඒකක</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | |
|---|---|---|
| 1. කමන්දළුව පර්යේෂණ ඒකකය | - | පුත්තලම |
| 2. පුත්තලම පර්යේෂණ ඒකකය | - | පුත්තලම |

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය**

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කලමනාකරණ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සංස්ථාව හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

**(2.13)** <u>සංස්ථා කජු අලෙවිසැල්</u> <u>දිස්ත්‍රික්කය</u>

| | | |
|---|---|---|
| 1. අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය | - | කොළඹ |
| 2. අංක 518, ගාලු පාර, කොළඹ 03 | - | කොළඹ |
| 3. පින්නවල අලි අනාථාගාර පරිශ්‍රය | - | පින්නවල |

**(2.14)** <u>සංස්ථා වරලත් කජු අලෙවිසැල් පිහිටා ඇති ස්ථාන</u>

1. රන්දිය පෘට්ස් ඇන්ඩ් නට්ස්, පයාගල, මග්ගොන.
2. සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත් පාර, අම්බලන්ගොඩ.
3. P & J සිටි, ගාමිණී මාවත, ගාල්ල.
4. ප්‍රෙෂ් ෆාම් ෂොප්, ගාළු පාර, හික්කඩුව.
5. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නාරාහේන්පිට.
6. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, වැලිසර.
7. Ranjanas 7 Stories, අංක 318, ගාළු පාර, කොලඹ 04.
8. ආනන්ද ෆුඩ් සිටි, අංක 272, අඟුරුවාතොට පාර, හොරණ.
9. පානදුර කෝප් සිටි, සී/ස පානදුර විවිධ සේවා සමුපකාර සමිතිය, ජනප්‍රිය මාවත, පානදුර
10. නිව් ඇමරිකන් චිකන් හට්, 16, ශ්‍රී සාරානන්ද මාවත, කළුතර.
11. සම්පත් ෆාමසි ඇන්ඩ් ග්‍රොසරි, 39E, මාතර පාර, අකුරැස්ස.
12. සියුම් ෆුඩ් ප්‍රඩක්ට්ස්, අංක 499, කෙලින් විදිය, කෑගල්ල.
13. සීමාසහිත යටිනුවර ගඟපලාත විවිධ සේවා සමුපකාර සමිතිය, පොල්ගහමුල හන්දිය, පේරාදෙණිය.
14. සීමාසහිත යටිනුවර මැදපලාත විවිධ සේවා සමුපකාර සමිතිය, ඇඹිල්මීගම, පිළිමතලාව.
15. සීමාසහිත මධ්‍යම පලාත් සමුපකාර සමිතිය, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර.
16. සීමාසහත පූජාපිටිය සමුපකාර සමිතිය, පූජාපිටිය.

17. සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිය, මාතලේ පාර අලවතුගොඩ.
18. සීමාසහිත කුණ්ඩසාලේ විවිධ සේවා සමුපකාර සමිතිය, මැණික්හින්න.
19. සිමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, පල්ලෙකැලේ.
20. සිමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, මාතලේ.
21. සිමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, ලග්ගල.
22. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය, අංක 21, ගාළු පාර, දෙහිවල.
23. උදම්සා කිරිහල, 978 D 3, පන්නිපිටිය පාර, පැලවත්ත.
24. තල් සංවර්ධන මණ්ඩලය, ගාළු පාර, බම්බලපිටිය.
25. තල් සංවර්ධන මණ්ඩලය, කන්කසන්තුරේ පාර, යාපනය.
26. තල් සංවර්ධන මණ්ඩලය, නල්ලූර් කෝවිල අසල, යාපනය.
27. තල් සංවර්ධන මණ්ඩලය, රෝහල පාර, යාපනය.
28. තල් සංවර්ධන මණ්ඩලය, ප්‍රධාන වීදිය, වවුනියාව.
29. ඕන් රෝ ෆාමසි, නො. 25, නාගොඩ පාර, කටුකුරුන්ද.
30. ගෝල්ඩන් මේඩ්, 144, ගාළු පාර, අහංගම.
31. නිව් මෝනිස් බේකරි, ගාළු පාර, මග්ගොන.
32. කැන්ඩි ලයින්ස්, පාර්ක් රෝඩ්, කෑගල්ල.
33. සාගර බේකර්ස්, අඟුරුවාතොට පාර, හොරණ.
34. රෝයි ග්‍රොසරි, මතුගම පාර, කටුකුරුන්ද හන්දිය, කළුතර
35. හරිස්චන්ද්‍ර මිල්ස්, ටැල්බට් වීදිය, ගාල්ල.
36. ජේ.එෆ්. ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස්, ජාවත්ත පාර, බම්බලපිටිය.
37. Colombo Cricket Club, මේට්ලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07.
38. EPPCO Mini Mart, ප්‍රධාන පාර, මාවනැල්ල.
39. ලයන් ග්‍රොසරි, මාකුඹුර, පන්නිපිටිය පාර, කොට්ටාව.
40. DGM Agriculture Dept., මාතර.
41. අබේගුණවර්ධන ස්ටෝර්ස්, දෙනියාය.
42. තලගල ස්ටෝර්ස්, තලගල.
43. කෝප් සිටි, කුණ්ඩසාලේ.
44. සෙප්කෝ සුපර්, බෝගම්බර.
45. DGM Agriculture Dept., ගාල්ල.
46. පැනොරාමා චයිනීස් රෙස්ටුරන්ට්, කොට්ටාව.
47. Namunukula Dairy Stores,වත්තල.

48. මාස්ටර් ෂොපර්, කොළඹ 01.

49.රුහුණු රසාර, මාතර.

50.රුහුණු රසාර, ලබුදූව.

51.අබේවර්ධන ස්ටෝර්ස්, දෙනියාය.

**(2.15)** <u>සංචාරක බංගලා</u> — <u>දිස්ත්‍රික්කය</u>

| | | |
|---|---|---|
| 1. පුත්තලම සංචාරක බංගලාව | - | පුත්තලම |
| 2. හාඩි සංචාරක බංගලාව | - | මඩකලපුව |

## (03) <u>සංස්ථාවේ සංවර්ධන කාර්යයන්</u>

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා සංස්ථාව ප්‍රධාන වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කරයි.

**1. ව්‍යාප්ති සහනාධාර වැඩසටහන**


**2. වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම**

**3. අළෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය**

**4. පර්යේෂණ සහ සංවර්ධනය**

### (3.1) <u>ව්‍යාප්ති සහනාධාර වැඩසටහන</u>

### (3.1.1) ශ්‍රී ලංකාවේ කජු වගාවේ සංයුතිය




වෙනත් ව්‍යාපෘති

* දි.ආ.ව.ඒ - 'දිවි නැගුම' ආර්ථික වගා ඒකක
* දි.ආ.දි.ප්‍ර.න- දිලිඳු ජනතාවගේ ආර්ථිකය දියුණු කිරීමේ හා ප්‍රජාව නගා සිටුවීමේ ව්‍යාපෘති
*ප්‍රා.ආ. ස.වැ - ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන වැඩසටහන-මාතලේ දිස්ත්‍රික්කය
* උ.ගැ.පු.දෙ - උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ ව්‍යාපෘතිය

## (3.1.2) කජු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම

### (3.1.2.1) වගා වපසරිය වැඩිකිරීම

ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත සමස්ත කජු වගා භූමි ප්‍රමාණය අක්කර 142608කි. 2016 වර්ෂයේදී දිස්ත්‍රික්ක 18 ක සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 125 ක් ආවරණය වන පරිදි බද්ධ කජු අක්කර 2500 ක් හා බීජ කජු අක්කර 2000 ක් වගා කරන ලදී. ඒ යටතේ ප්‍රතිලාභී පවුල් 3298ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත.

<u>කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය</u>

| දිස්ත්‍රික්කය | බද්ධ කජු ( අක්කර) | බීජ කජු ( අක්කර) |
|---|---|---|
| 1. පුත්තලම | 400 | - |
| 2. කුරුණෑගල | 300 | - |
| 3. හම්බන්තොට | 200 | - |
| 4. අනුරාධපුරය | 550 | - |
| 5. අම්පාර | - | 400 |
| 6. බදුල්ල | 150 | - |
| 7. මහනුවර | 25 | - |
| 8. රත්නපුර | 25 | - |
| 9. මාතලේ | 150 | - |
| 10. පොළොන්නරුව | 150 | - |
| 11. මොණරාගල | 250 | - |
| 12. මඩකලපුව | 50 | 350 |
| 13. ත්‍රිකුණාමලය | 50 | 300 |
| 14. වවුනියා | 50 | 200 |
| 15. මන්නාරම | 25 | 250 |
| 16. මුලතිව් | 75 | 300 |
| 17. කිළිනොච්චි | 50 | 150 |
| 18. යාපනය | - | 50 |
| **එකතුව** | **2500** | **2000** |

### (3.1.2.2) කජු වගා සහනාධාර වැඩසටහන යටතේ ගොවීන්ට ප්‍රතිලාභ ලබාදීම

බද්ධ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු 9,500/- ක මුදලක් සහ බීජ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු 3,500/- ක් වශයෙන් මෙම සහනාධාර වැඩසටහන යටතේ



`

ප්‍රතිපාදන වෙන්කර ඇත. එසේ වුවද, මෙම වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් මෙම කාර්යය සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ. වර්තමානයේදී සහනාධාර වැඩසටහන යටතේ තෝරාගත් ගොවීන්හට ගොවි පුහුණුව සහ අනෙකුත් ව්‍යාප්ති සේවාවන් නොමිලයේ ලබාදෙන අතර, වගාභූමි ප්‍රමාණයට සරිලන පරිදි අවශ්‍ය බද්ධ කජු පැළ සහ බීජ කජු පැළ නොමිලයේ ලබාදීම සිදුකරනු ලබයි. මෙම කටයුතු සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල 10 ක් හරහා කජු වගාකරනු ලබන දිස්ත්‍රික්ක 18 ක් මගින් සිදුකරනු ලබයි.

**(3.1.2.3) ව්‍යාප්ති සේවා පුළුල් කිරීම**

ව්‍යාප්ති සේවා පුළුල් කිරීමේ අරමුණින් මන්නාරම් දිස්ත්‍රික්කය සඳහා ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කරන ලද අතර, එමගින් මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්ක ආවරණය කරනු ලබයි.

**(3.2) වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායිතාවය වර්ධනය කිරීම**

**(3.2.1) කජු වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම**

**(3.2.1.1) රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

සංස්ථාවේ ශාක අභිජනන මධ්‍යස්ථානවල ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය යටතේ (GAP) උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මව්බීජ මෙ.ටොන්13.91ක් නිෂ්පාදනය කරන ලදී. බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය කිරීමේදී එම මව්බීජ හා මව්ගස් වලින් ලබාගත් රිකිළි 264000 ක ප්‍රමාණයක් භාවිතා කරන ලදී.

| බීජ උද්‍යානය | දිස්ත්‍රික්කය | භූමි ප්‍රමාණය ( අක්කර) |
|---|---|---|
| 1. විලච්චිය | අනුරාධපුරය | 25 |
| 2. නාලන්ද | මාතලේ | 75 |
| 3. මහඔය | අම්පාර | 81 |
| 4. සුදුවතුර ආර | මොණරාගල | 50 |
| **එකතුව** | | **231** |



`

### (3.2.1.2) තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් වලින් ඉහළ ගුණාත්මයෙන් යුතු නව ප්‍රභේද වලින් සමන්විත බද්ධ පැළ 209125 ක් නිෂ්පදනය කර, සහනාධාර වැඩසටහන සඳහා සහ පෞද්ගලික වතු හිමියන් සඳහා නිකුත් කරන ලදී.

**2015 වර්ෂයේ බද්ධ පැළ නිෂ්පාදනය**

| පැළ තවානේ නම | නිපදවන ලද බද්ධ පැළ |
|---|---|
| 1. කමන්දළුව | 38602 |
| 2. දඹුල්ල | 29768 |
| 3. මිහින්තලේ | 79846 |
| 4. අළුත්තරම | 19044 |
| 5. කුඹුක්කන | 18701 |
| 6. හාඩි | 7401 |
| 7. චන්ද්‍රිකා වැව | 15763 |
| **එකතුව** | **209125** |

සහනාධාර යෝජනා ක්‍රමයට අවශ්‍ය බීජ පැළ 78500 ක් නිපදවීම සඳහා මඩකලපුව, ත්‍රිකුණාමලය, වවුනියා, මන්නාරම, මුලතිව්, කිළිනොච්චි, යාපනය හා අම්පාර දිස්ත්‍රික්කවල පැළ තවාන් 46ක් ස්ථාපනය කරන ලදී.

### (3.2.1.3) වතුයායන්වල නව වගාව

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පුත්තලම, කමන්දළුව, එළුවන්කුලම, හාඩි, ඔයාමඩුව, මාන්කර්ණි, මඩකලපුව යන වතුයායන්වල විශාල වශයෙන් සංවර්ධන කටයුතු සිදුකල අතර, මෙම වැඩසටහන් වලදී විශේෂයෙන්ම උතුරු පලාතේ පිහිටි කොණ්ඩච්චි වතුයායේ හා නැගෙනහිර පලාතේ පිහිටි මාන්කර්ණි වතුයාය සංවර්ධනය කිරිම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබාගන්නා ලදී. මෙම වගා කටයුතු සඳහා තාක්ෂණික සහයෝගිතාවය හා කජු පැළ, සංස්ථාව විසින් ලබාදෙන ලදී. සංස්ථාවේ සෘජු අධික්ෂණය යටතේ කොණ්ඩච්චි වතුයායේ අක්කර 150 ශුද්ධකර නව වගාව සඳහා බිම් සකසා අක්කර 100 ක පැළ සිටුවන ලදී. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනරීන් හි පිහිටි වතුයායන් ශ්‍රී ලංකා යුධ හමුදාව භාරයේ පවතින අතර එම වතුයායන්වල

නඩත්තු කටයුතු සඳහා උපදේශාත්මක සේවාවන් අඛණ්ඩව ලබාදෙන ලදී. මීට අමතරව සංස්ථාව සතු පරිණත කජු වගා අක්කර 2000ක පමණ ප්‍රමාණයක වගා පුනරුත්ථාපන කටයුතු සිදුකරන ලද අතර, වතුයායන් සඳහා රසායනික පොහොර හා පලිබෝධ මර්ධනය සඳහා කෘෂිරසායනික ලබාදෙන ලදී.

**(3.2.1.4) ඵලදායිතාවය වැඩි දියුණු කිරීම**

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් "හෙලෝපෙල්ටිස්" රෝග මර්දනය කිරීම සඳහා නව රසායනික සංයෝගයක් සාර්ථකව අත්හදා බලා ඇති අතර ඒ පිළිබඳව ගොවීන් 150 දෙනෙකු සඳහා පුහුණුව ලබාදී ඇත. මීට අමතරව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් මුලතිව් හා පුත්තලම දිස්ත්‍රික්කවල ගොවීන් සඳහා පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**(3.3) අලෙවි හා පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය**

**(3.3.1) පසු අස්වනු තාක්ෂණ සංවර්ධනය**

**(3.3.1.1) පිරිසැකසුම්කරුවන්ගෙන් කජු මද මිලට ගැනීම**

වෙළඳපොල තරඟකාරී තත්ත්වයනට මුහුණදීම හා පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් මෙම වර්ෂයේදී ගොවීන්ගෙන් ලෙලිකජු මිලදී ගැනීම වෙනුවට කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජු මද මිලදී ගන්නා ලදී. මේ නිසා තරඟකාරී වෙළඳපොල මිල පරාසයක් ස්ථාපිත විය. මෙම වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ලැබුණු මෙට්‍රික් ටොන් 109ක අස්වැන්නද සංස්ථා කර්මාන්තශාලාවල පිරිසැකසුම් කරන ලදී.

## (3.3.1.2) කජු පිරිසැකසුම් කර්මාන්තය ශක්තිමත් කිරීම

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කජු මද නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම මගින් ඉහල මිලක් උපයාගැනීම පිණිස උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහනට අනුකූලව කජු පිරිසැකසුම්කරුවන් සඳහා විජලන යන්ත්‍ර හා විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන කජු කැපීමේ යන්ත්‍ර ලබාදීම, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතයෙන් (GMP) හා අගය එකතු කිරීම හා ප්‍රමිති තත්ත්වයන් සම්බන්ධව පිරිසැකසුම්කරුවන් පුහුණු කිරීමත්, පිරිසැකසුම් සමිති සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සහායවීම හා වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා සහාය ලබාදීම සිදුකරන ලදී. 2016 වසරේදී මුලතිව් හා මන්නාරම් දිස්ත්‍රික්කවල ගොවීන්ට හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් හට පිරිසැකසුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 03 ක් පවත්වන ලදී. මේ යටතේ ගොවීන් 100 කට අධික පිරිසක් සඳහා පුහුණුව ලබාදී ඇත.

## (3.3.3) කජු පිරිසැකසුම් කිරීම හා අලෙවිකරණය

සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන පුත්තලම හා නැඳගමුව (ගම්පහ දිස්ත්‍රික්කය) පිහිටා ඇත. සංස්ථා වතුයායන්ගෙන් ලබාගන්නා ලද ලෙලිකජු පිරිසැකසුම් කර, අගය එකතු කරන ලද කජු මද කොල්ලුපිටිය හා රාජගිරියේ පිහිටි සංස්ථා අලෙවිසැල් 02 කට අමතරව 2016 වසරේදී අලෙවි හා බෙදා හැරීමේ ජාලය ශක්තිමත් කිරීම සඳහා පින්නවල අලි අනාථාගාර පරිශ්‍රයේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නව කජු අලෙවිසැලක් විවෘත කරන ලදී. දිවයිනේ ව්‍යාප්තව පවතින වරලත් අලෙවිසැල් 51ක් උපයෝගී කරගෙන පාරිභෝගිකයන් වෙත අලෙවි කටයුතු පවත්වාගෙන යන ලදී.

2016 වර්ෂයේදී කජු පුහුලන් වට්නි සහ ගම්මිරිස් තැවරූ කජු වෙළඳපොළට නිකුත්කර ඇත. නව තාක්ෂණික ක්‍රම භාවිතය, අගය එකතු කිරීම හා උසස් කජු නිෂ්පාදන අළෙවි කිරිම මගින් රු. මිලියන 84.59ක මුදලක් උපයා ගැනීමට සංස්ථාව සමත්විය.

**(3.3.4) කජු නිෂ්පාදන අපනයනය හා විදේශ විනිමය ඉපැයීම**

**(3.3.4.1)** වර්ෂ 2016 දී උසස් තත්ත්වයේ අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 57.64ක් ජාත්‍යන්තර වෙළඳපොළට ඉදිරිපත් කිරිම මගින් රු. මිලියන 99.97ක විදේශ විනිමය ඉපැයිමට ශ්‍රී ලංකාව සමත්විය. 2015 වර්ෂයේ අගය එකතුකරන ලද කජු මද මෙට්‍රික් ටොන් 105.66ක් අපනයනය කිරීමෙන් රු. මිලියන 174.06 ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත. මේ අනුව අපනයන ධාරිතාවයේ හා විදේශ විනිමය ඉපයීමේ සුළු අඩුවීමක් පෙන්නුම් කලද, සංචාරක කර්මාන්තයේ සීඝ්‍ර වර්ධනයත් සමඟ කජු මද සඳහා දේශීය ඉල්ලුම ඉහළ යාමත්, ඒ අනුව දේශීය පරිභෝජනය ඉහළයාම මෙයට හේතු වී ඇත.

**(3.3.5) කජු ආනයනය**

**(3.3.5.1) දේශීය පරිභෝජනය සඳහා ආනයනය**

දේශීය වශයෙන් කජු පරිභෝජනය ඉහළ යාමත්, දේශගුණික විචල්‍යතා එනම් මල් හටගන්නා කාලසීමාව තුල අධික වර්ෂාපතනය ලැබීම නිසා අපේක්ෂිත කජු අස්වැන්න අඩුවීම සමඟම විශේෂයෙන් ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාසවල කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන්ට අවශ්‍ය ලෙලිකජු දේශීය වෙළඳපොලතුල හිඟතාවයක් ඇතිවිය. මේ සඳහා විසඳුමක් වශයෙන් කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන් සඳහා බදු සහන යටතේ ලෙලිකජු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදෙන ලදී. ශ්‍රී ලංකා රේගුවේ වාර්තාවලට අනුව, ලෙලිකජු මෙට්‍රික් ටොන් 1622ක් හා කජු මද මෙට්‍රික් ටොන් 263ක් ආනයනය කර කුඩා පරිමාණ නිෂ්පාදකයන් විසින් පිරිසැකසුම්කරුවන් රාශියක් අතර බෙදාහරින ලදී. මේ අනුව, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන පවුල්වල ජීවනෝපාය ස්ථාවර කිරීම සඳහා සංස්ථාවට මැදිහත්වීමට අවස්ථාව ලැබුණි.

**(04) පර්යේෂණ හා සංවර්ධනය**

ශාක අභිජනනය, පොහොර භාවිතය, කජු වගාවේ රෝග හා පලිබෝධ මර්ධනය, බද්ධ කිරීමේ විවිධ තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම, බද්ධ හා බීජ කජු වගාව, අස්වැන්න සහ අතුරුභෝග වගාව පිලිබඳ අඛණ්ඩ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ

පීඨය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ හා කළමනාකරණ කමිටුව මගින් මෙම වැඩසටහන්වල ප්‍රගතිය ඇගයීම සිදුකරන ලදී. මෙම පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ති සේවා ජාලය මගින් උපදේශන සේවා ලබාදීමේදී මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන, පත්‍රිකා,වීඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් මගින් ගොවීන්වෙත ලබාදෙන ලදී. මේ යටතේ පැළ බද්ධ කිරීම සඳහා පැච් බඩින් ක්‍රමවේදය සාර්ථකව අත්හදා බලා ඇති අතර කොණ්ඩච්චි වතුයායේ ඒ යටතේ නව වගාවක් ස්ථාපිත කරන ලදී.

**(05)** <u>අයවැය</u>

**(5.1)**

| වර්ගය | අරමුදල් ආයෝජනය - 2016 (රු. මිලියන) | | |
|---|---|---|---|
| | රාජ්‍ය ආයෝජන | උපයාගත් අරමුදල් | එකතුව |
| ප්‍රාග්ධන වියදම් | 40.0 | 2.9 | 42.9 |
| පුනරාවර්තන වියදම් | 48.0 | 80.7 | 128.7 |
| **එකතුව** | **88.0** | **83.6** | **171.6** |

**(5.2)** <u>වාණිජමය කාර්යයන් තුලින් 2016 වර්ෂයේ ඉපැයීම්</u>

| | | (රු. මි) |
|---|---|---|
| කජු මද අළෙවිය | - | 86.19 |
| කජු මව් බීජ හා පැළ අළෙවිය | - | 7.33 |
| පොල් අළෙවිය | - | 1.43 |
| | | 94.95 |

**(06)** **පරිපාලන කටයුතු**

**(6.1)** කුඩා කජු ඉඩම් හිමියන්, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් හා පාරිභෝගිකයන් වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණ ඇතිව විධිමත් කලමනාකරණ භාවිතයන් සිදුකිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය ව්‍යවසායක් ලෙස සේවාවන් සපයන අතර, ලාභ ඉපැයීමද අරමුණුකර ඇති බැවින් සංස්ථාවේ සියළුම පාර්ශවකරුවන්ගේ සහාය මේ සඳහා ලබාගත හැකිවිය.



`

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සහායද නොමඳව ලැබුණි.

රජයේ නව සංවර්ධන උපායමාර්ගවලට අනුකූලව ජනතාවගේ ආදායම් උත්පාදනය හා සංස්ථාවේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහාද, මේ අනුව කටයුතු කලහැකි විය.

**(6.2) 2016- 12-31 දිනට කාර්යය මණ්ඩලයේ තත්ත්වය**

| අනුමත කාර්යය මණ්ඩලය | | 2016.12.31 දිනට කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය (HM) | 02 | 02 |
| මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිය (MM) | 07 | 05 |
| කනිෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය (JM) | 26 | 20 |
| කළමනාකරණ සහකාර (MA) | 122 | 95 |
| සුළු ශ්‍රේණිය (PL) | 67 | 71 |
| **එකතුව** | **224** | **193** |

මෙයට අමතරව සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථාන, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා මධ්‍යම පැළ තවාන් වල මාසික අවශ්‍යතා මත චෙක් රෝල් කම්කරුවන් 350 ක් පමණ සේවයේ යොදවා ඇත.

**(07)** <u>ජයග්‍රහණ</u>

වර්ෂ 2014 දී හා 2015 දී වාර්තාගත වූ අලෙවි කාර්යයන් මගින් ලාභ ලබන තත්ත්වය වර්ෂ 2016 දී අඛණ්ඩව පවත්වාගැනීමට සමත්විය. මේ සඳහා සංස්ථාවේ වාණිජමය ක්‍රියාකාරකම් උපයෝගි කරගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායි හා කාර්යක්ෂම මඟ පෙන්වීම හා කාර්යය මණ්ඩලයේ කැපවීම මේ සඳහා හේතු සාධක විය.

වාණිජමය ක්‍රියාකාරකම් මගින් 2016 වර්ෂය තුලදි සංස්ථාව උපයනු ලැබූ ශුද්ධ ලාභය රුපියල් මිලියන 31.6 කි.

පහත සඳහන් බාධක නිසා අත්පත් කරගත් ලාභය මීට වඩා ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව නොලැබුණි.

★ අයහපත් කාලගුණ තත්ත්වයන් මත එනම් මල් හටගන්නා කාලසීමාව තුල අධික වර්ෂාපතනය ලැබීම නිසා වතුයායන් වල අස්වැන්න අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම.

★ දේශීය ලෙලිකජු ඉල්ලුමට සරිලන සැපයුමක් වාර්තා නොවීම නිසා කජු නිෂ්පාදනවලට ඉහළ මිලගණන් නියම වීම.

★ කම්කරු වියදම් හා ද්‍රව්‍ය වියදම් ඉහළ යාම.

★ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදානයන් සීමාකිරීම හේතුවෙන් නව කාර්යයන් ආරම්භ කිරීමේදී මෙන්ම අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකර ගැනීමේදී බාධා පැමිණුනි. මේ අනුව මෙම කාර්යයන් අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා සංස්ථාව විසින් උපයාගත් අරමුදල් උපයෝගී කර ගැනීමටද සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජමය හා සංවර්ධන කාර්යයන්හි ආයෝජනය සඳහා අරමුදල් හිඟතාවය ඇතිවිය.

## (08) ස්තුතිය

2016 වර්ෂය තුලදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියළුම සේවාවන් සැපයීම සහ වාණිජ කටයුතු ඉතා සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය ඔවුන්වෙත පුද කරමි.

විශේෂයෙන්ම සංස්ථාවේ සියළුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වා ගෙනයාම සඳහා සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සියළු කාර්ය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතුකල අතර, ඔවුන්ගේ සේවයද අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම්හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියළුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ළඟාකර ගැනීමට හැකිවූ අතර, එයද අගය කරමි.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු කබීර් හෂීම් මැතිතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා එම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අපවෙත ලබාදුන් මග පෙන්වීම වෙනුවෙන්ද ස්තුතිවන්ත වෙමි.

**දම්සිරි බණ්ඩාර කරුණාරත්න**

**සභාපති**

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**

## අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජූනි මස 2 වනදා නිකුත් කල චක්‍රලේඛ අංක පී.ඊ.ඞී/12 ට අනුව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 28 වන දිනට පෙර විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

**ආරම්භය**

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අංක 60/7 දරණ ගැසට් නිවේදනය මගින් 1973 මැයි 25 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියන 40 ක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවන ලදී.

**ප්‍රතිඵල**

ප්‍රවර්ථන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස්වීම පිලිබඳ දත්ත ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර ඇත.

**ව්‍යාපාර සමාලෝචනය**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර, ඒ පිලිබඳ ඇගයීමක් සභාපතිතුමාගේ වාර්තාවේ ඇතුලත්කර ඇත.

**දේපල පිරියත හා උපකරණ**

මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්ථන වසරට අදාලව දේපල පිරියත හා උපකරණවල සිදුවූ වෙනස්කම් සටහන් අංක 1 මගින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙලඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.



`

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයාට උපදෙස් දීම.

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු කිරීම.

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම දියුණු කිරිමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු කිරිම .

- කජු වගාකිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරිම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

- කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිෂ්චය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

- කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

- කජු වගා කිරීම පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අළෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

- කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මුලික සංවිධානය පිහිටුවීම සහ ඒවා පිහිටුවීමට ආධාරදීම.



`

- කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝකයේ වෙළඳපොලවල්වල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතු වලට ආධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහ දැක්වීම.

**සංචිත**

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මුළු සංචිතවල සංයුතිය සඳහන්ව ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

2016 දෙසැම්බර් 31 දින වන විට තේරිපත්වී සිටි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

**(1) 2016.01.01 දින සිට 2016.02.23 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| **i)** | **ඩී.බී.කරුණාරත්න මහතා** | **-** | **සභාපති** |
| ii) | එම්.ඩබ්.එම්.බණ්ඩාරතිලක මහතා | - | නියෝජ්‍ය සභාපති |
| iii) | ආර්.කේ.ජයලත් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) |
| iv) | එම්.ආර්.එම්.අයි.රීසා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v) | වී.මංචනායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

**(2) 2016.02.24 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්**

| | | | |
|---|---|---|---|
| **i)** | **ඩී.බී.කරුණාරත්න මහතා** | **-** | **සභාපති** |
| ii) | එම්.ඩබ්.එම්.බණ්ඩාරතිලක මහතා | - | නියෝජ්‍ය සභාපති |
| iii) | ආර්.කේ.ජයලත් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) (2016.04.27 දක්වා) |



`

| | | | |
|---|---|---|---|
| iv) | ඒ.ඒ.ඩී.එස්. අතපත්තු මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) (2016.05.26 දින සිට) |
| iv) | එම්.ආර්.එම්.අයි.රීසා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| v) | වී.මංචනායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vi) | කේ.ලිංගරාජා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| vii) | ඒ.එස්.එම්.ෆස්මි මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

2016 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - වී.යූ.ලියනගේ මහතා (2016.03.30 දක්වා)
කීර්ති ජයකොඩිආරච්චි මහතා (සාමාන්‍යාධිකාරී) (2016.04.27 දින සිට)

**විගණන කමිටුව**

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශනයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට සහ සේවකයන්ට ගෙවියයුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසියාකාරව ගෙවා ඇත.

**පාරිසරික ආරක්ෂාව**

පරිසරයට අහිතකර කිසිඳු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත් වී නොමැත.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මගින් ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

**විගණකවරු**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,

**කීර්ති ජයකොඩිආරච්චි**

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**



`

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2005.07.01 දිනැති අංක 31 දරණ : (PED 31) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හා එම චක්‍රලේඛයට අදාලව වරින්වර සිදුකරන ලද සංශෝධනයන් වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අංක 51, 53 හා 55 යන චක්‍රලේඛයන් (PED 51, PED 53, හා PED 55) මඟින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලද අතර, එය සාමාජිකයන් හත් දෙනෙකුගෙන් හා එක් නිරීක්ෂකයෙකුගෙන් යුක්ත සමස්තය 08 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් විය.

අදාල කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරයා ද, කමිටුවේ ලේකම්වරයා ලෙස මෙම සංස්ථාවේ සාමානාධිකාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ද කටයුතු කරන ලදී.

2016 වර්ෂය හා අදාලව පවත්වන ලද සමස්ත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන 04 ක් වූ අතර, එම රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ හා නිරීක්ෂකයන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

01. ආර්.කේ. ජයලත් මහතා : කමිටු සභාපති 1/1
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2016.04.28 දින දක්වා (මහා භාණ්ඩාගාර නියෝජිත)

02. ඒ.ඒ.ඩී.එස් අතපත්තු මහත්මිය : කමිටු සභාපතිනිය 3/3
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2016.06.23 දින සිට (මහා භාණ්ඩාගාර නියෝජිත)

03. වී.පී.මංචනායක මහතා : කමිටු සාමාජික 4/4
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

04. එම්.ආර්.එම්.අයි. රීසා මහතා : කමිටු සාමාජික 3/4
විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

05. ඩී.කේ. ජයකොඩිආරච්චි මහතා : කමිටු ලේකම් 4/4
සාමාන්‍යාධිකාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්- 2016.04.27දින සිට

06. පී.බී. කොඩිකාර මහතා : කමිටු සාමාජික 3/3
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - 2016.09.21 දින දක්වා

07. එම්.ටී.එස්.කේ. පීරිස් මහතා : කමිටු සාමාජික 3/3
සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්-2016.09.21 දින දක්වා

08. වී.යු. ලියනගේ මහතා : කමිටු ලේකම් 4/4

සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

(2016.03.30 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා කමිටු ලේකම් වශයෙන් කටයුතු කරන ලද අතර 2016.04.27 දින සිට කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.)

09. ආර්.පී.එස් පද්මිණී මහත්මිය : කමිටු නිරීක්ෂක 3/3

විගණන අධිකාරී (විගණකාධිපති දෙපාර්තමේන්තුව)

10. එච්.පී.කේ.සුභද්‍රා මහත්මිය : කමිටු නිරීක්ෂක 1/1

විගණන පරීක්ෂක - 2016.06.23 දින සඳහා පමණක්

2016 වර්ෂයේ පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී 2016 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව සිය සමස්ත ක්‍රියාකාරකම් මඟින් අත්කර ගෙන ඇති ප්‍රගතිය පිළිබඳව ඉදිරිපත් කර තිබූ වාර්තාව සම්බන්ධයෙන් ද, 2016 වර්ෂයේ පළමු කාර්තුව තුළදී සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පාලනාධිකාරිය වෙත නිකුත් කරන ලද විගණන වාර්තාවල ඇතුලත් නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණයන්ට අනුව පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරිපත් කර තිබූ වාර්තාව සම්බන්ධයෙන් ද කමිටුව විසින් දීර්ඝ සමාලෝචනයක් සිදුකරන ලදී.

2016 වර්ෂයට අදාලව පවත්වන ලද දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී 2015 වර්ෂය සඳහා මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත විගණන ඡේද සඳහා සංස්ථා පාර්ශවයෙන් සිදුකරනු ලබන අදහස් දැක්වීම් හා ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරිපත් කර තිබූ වාර්තාව සම්බන්ධයෙන් කමිටුවේ අවධානය යොමු විය. ඒ අනුව වාර්තාවේ සඳහන් එක් එක් විගණන නිරීක්ෂණයන් වෙන් වෙන් වශයෙන් ගෙන එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් කමිටුව වෙත ඉදිරිපත්කර තිබූ කෙටුම්පත් වාර්තාව මඟින් ඉදිරිපත්කර තිබූ අදහස් දැක්වීම් හා ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලද අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව සේවක ප්‍රතිලාභ පිළිබඳව හෙළිදරව් කිරීම් සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 41/90 ට අනුව වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් යන කරුණු දෙකට අදාලව සංස්ථා පාර්ශවයෙන් ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳව කෙටුම්පත් වාර්තාවේ අන්තර්ගත වූ කරුණු දැක්වීම් අදාල සංශෝධනයන්කර අදාල කෙටුම්පත් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට විගණන හා කළමනාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.



`

2016 වර්ෂයේ තුන්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී 2016 වර්ෂයේ දෙවන කාර්තුව තුලදී සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පාලනාධිකාරිය වෙත නිකුත් කරන ලද විගණන වාර්තාවල ඇතුලත් නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණයන්ට අනුව පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ වාර්තා සම්බන්ධයෙන් කමිටුව විසින් දීර්ඝ සමාලෝචනයක් සිදුකර සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

2016 වර්ෂයට අදාල හතරවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 2017 වර්ෂයට අදාල සංස්ථාවේ ක්‍රියාත්මක සැලැස්ම, සංස්ථාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ අතර, මෙම ලේඛනයන් හි අන්තර්ගතය සම්බන්ධයෙන් කමිටු රැස්වීමේදී දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා විය. ඒ අනුව එම ලේඛන සම්බන්ධයෙන් අදාල නිර්දේශයන් සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙහිදී, 2015 වර්ෂයට අදාලව මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත්කර ඇති විගණකාධිපති වාර්තාවේ නොවිසඳුනු විගණන ඡේදයන් පිළිබඳව සාකච්ඡා කරන ලද අතර ආයතනයේ කාර්ය සාධනය, සංස්ථාවේ ක්‍රියාකාරකම් අනුව අදාල වන රජයේ බදු, සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ හා සංවර්ධන කටයුතු, සේවක පැමිණීම,පිටවීම හා කාර්යාල වේලාවන් සහ සංස්ථාවට නීතිමය අයිතිය නොමැති වගා ඉඩම් පවරා ගැනීම යන කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලදී.

එසේම 2016.07.01 දින සිට 2016.11.30 දින දක්වා වන මාස 05 ක කාලසීමාව තුලදී සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පාලනාධිකාරිය වෙත නිකුත්කරන ලද විගණන වාර්තාවල ඇතුලත් නිරීක්ෂණයන් හා එම නිරීක්ෂණයන්ට අනුව පාලනාධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරිපත්කර තිබු වාර්තාව සම්බන්ධයෙන් ද කමිටුව විසින් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලද අතර, එහිදී සංස්ථාවේ වරලත් අලෙවිසැල් වෙත සිදු කරනු ලබන කප්පු මද ණයට විකුණුම් සඳහා මුදල් අය කරවා ගැනීමේදී පවතින කාලප්‍රමාදයන් පිළිබඳව කමිටුවේ විශේෂ අවධානය යොමු විය. ඒ අනුව අදාල නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**ඒ.ඒ.ඩී.එස් අතපත්තු**

**සභාපති**

**විගණන හා කළමනාකරණ කමිටුව**

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 01. 2016 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

## 01. කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය හා සංවර්ධන වැඩසටහන්

### 1.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම වර්ෂය තුල බද්ධ කජු අක්කර 2500 ක් හා බීජ කජු අක්කර 2000 ක් වශයෙන් මුළු අක්කර 4500 ක් දිස්ත්‍රික්ක 18 ක් ආවරණය වන පරිදි වගාකර ඇත. ගොවි පවුල් 3298 ක් සඳහා මෙමගින් ප්‍රතිලාභ ලැබුණි. මේ සඳහා වැයවුණු මුළු වියදම රු.මිලියන 13.95 කි.

## 02. වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම

### 2.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

විවිධ ප්‍රදේශවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර කුඩා කජු ඉඩම්හිමියන්වෙත ලබාදිම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය සහ ඔයාමඩුව, අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය, මඩකලපුව දිස්ත්‍රික්කයේ මාණ්කර්නි, මන්නාරම දිස්ත්‍රික්කයේ කොණ්ඩච්චි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරවිල සහ මොණරාගල දිස්ත්‍රික්කයේ සුදුවතුරආර යන ශාක අභිජනන මධ්‍යස්ථාන නඩත්තුකරන ලදී. ව්‍යාප්ති සේවා සහ වාණිජමය කාර්යයන් සඳහා අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් සමන්විත මවුබීජ මෙ.ටොන්13.91ක් හා අංකුර 264000 ක් මෙමගින් ලබාගන්නා ලදී. මේ සඳහා වැයවු මුළු මුදල රු. මිලියන 13.98 කි.

### 2.2 නිෂ්පාදනය වැඩිදියුණු කිරිම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් “හෙලෝපෙල්ටිස් ”රෝග මර්දනය කිරීම සඳහා නව රසායනික සංයෝගයක් සාර්ථකව අත්හදා බලා ඇති අතර ඒ

පිළිබඳව ගොවීන් 150 දෙනෙකු සඳහා පුහුණුව ලබාදී ඇත. එසේම, කඳ හා මුල් විදින කුරුමිණියා මර්දනය කිරීම සඳහා ප්‍රධාන වතුයායන් 04 හි ආසාධිත ශාක සඳහා පළිබෝධනාශක යොදන ලදී. මේ සඳහා වැය වු මුදල රු.මිලියන 1.18 කි.

## 2.3 පැළ තවාන් කලමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් 07 ක් කමන්දළුව වතුයායේ හා අළුත්තරම, හාඩි, මිහින්තලේ, චන්ද්‍රිකාවැව, දඹුල්ල හා කුඹුක්කන පිහිටා ඇත. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන බද්ධ පැළ නිපදවීම සඳහා සාදන ලද පොලිදැල් ගෘහ 06 ක් කමන්දළුව, මිහින්තලේ, මඩකලපුව, අළුත්තරම පැළ තවාන්වල ඉදිකර ඇත. මෙම තවාන්වල 2016 මහ කන්නය සඳහා උසස් තත්ත්වයේ බද්ධ පැළ 209125 ක් නිෂ්පාදනය කර ගොවීන්වෙත ලබාදෙන ලදී.

## 03. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ ඝනත්වය, කජු වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය, අතුරු භෝග වගාව, බද්ධ හා බීජ වගාවන්, බද්ධ කිරීමේ තාක්ෂණික ක්‍රමවේද අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් වැඩමුළු සහ ව්‍යාප්ති සේවාවන් මගින් ගොවීන් දැනුවත් කරනු ලැබේ. මේ යටතේ පැළ බද්ධ කිරීම සඳහා පැච් බඩින් ක්‍රමවේදය සාර්ථකව අත්හදා බලා ඇති අතර කොණ්ඩච්චි වතුයායේ ඒ යටතේ නව වගාවක් ස්ථාපිත කරන ලදී. මේ සඳහා වැයවු මුදල රු. මිලියන 3.14 කි.

## 04. සංස්ථා වතුයායන් නඩත්තු කිරීම හා වගා පුනරුත්ථාපනය

කොණ්ඩච්චි වතුයායේ මුළු අක්කර 150 කට වඩා වැඩි ප්‍රමාණයක් කැලෑ එළි කිරීමේ කටයුතු අවසන්කර ඇති අතර එයින් අක්කර 100 ක පමණ මේ වනවිට පැළ සිටුවා ඇත. නව වගාවක් ලෙස මහඔය පැළ 800 ක් සිටුවා ඇති අතර සුදුවතුරආර බීජ උද්‍යානයේ පැළ 500 ක් සිටුවීම සඳහා වල් මර්දන කටයුතු අවසන් කර ඇත. වතුයායන්වලින් මෙට්‍රික් ටොන් 109 ක ලෙලිකජු අස්වැන්නක් ලැබුණි. මීට අමතරව ඵලදායිතාවය ඉහළ නැංවීම පිණිස රසායනික පොහොර

යෙදිම, වල් මර්ධන කටයුතු,රෝග හා පළිබෝධ මර්ධනය, ක්ෂේත්‍ර මාවත් නඩත්තු කිරීම, කප්පාදු කිරීම ආදී ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේදයන්ද සිදුකරන ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු. මිලියන 14 .64 කි.

## 05. පසු අස්වනු තාක්ෂණය

### 5.1 අලෙවිකරණය හා පිරිසැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය

සංස්ථා වතුයායන්ගෙන් ලද ලෙලි කජු අස්වැන්න සහ කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් මිලදිගත් කජු මද පුත්තලම සහ නැඳගමුවෙහි පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවලදී පිරිසැකසුම් කරන ලදී. එවා අගය එකතුකල නිෂ්පාදන ලෙස සංස්ථාවේ ප්‍රධාන අලෙවිසැල් මගින් අලෙවිකරන ලදී. මේ සඳහා වරලත් අලෙවිසැල් 51 කින් සමන්විත සංස්ථා අලෙවිසැල් ජාලයක් උපයෝගි කරගන්නා ලදි.

අගය එකතුකල නව නිෂ්පාදන 02ක් වන ගම්මිරිස් තැවරූ කජු හා කජු පුහුලන් වට්නි පාරිභෝගිකයන් වෙත ඉදිරිපත්කල හැකිවූ අතර, මුලතිව් හා මන්නාරම් දිස්ත්‍රික්කවල ගොවීන්ට හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් හට පිරිසැකසුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 03 ක් පවත්වන ලදී. මේ යටතේ ගොවීන් 100 කට අධික පිරිසක් සඳහා පුහුණුව ලබාදී ඇත. අලෙවි කටයුතු මගින් සංස්ථාව උපයන ලද මුළු ආදායම රු .මිලියන 84.59 කි.

## 06. මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකරන ලදී. මෙමගින්කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසුණු අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉඩප්‍රස්ථාව සැලසුනි. කාර්යය මණ්ඩලයේ 60 දෙනෙකු සඳහා රජයේ අනුමැතියලත් පෞද්ගලික අංශයේ පුහුණු කිරීම් ආයතනයක් මගින් "ආකල්ප හා පෞර්ෂත්ව සංවර්ධනය" යන මැයෙන් පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මේ සඳහා වැය වූ මුදල රු.මි 0.13 කි.

**<u>ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග</u>**

කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ප්‍රධාන මධ්‍යකාලීන ක්‍රියාමාර්ග කිහිපයකි.

**01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම**

**02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම**

**03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය**

**04. මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම.**

**01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම**

**1.1 <u>ව්‍යාප්ති වැඩසටහන් යටතේ කජු වගාව</u>**

ශ්‍රී ලංකාවේ කජු වගාව ප්‍රධාන වශයෙන් වියළි දේශගුණික කලාපය තුල ව්‍යාප්තව ඇත. පසුගිය දශක 03 ක කාලයක ක්‍රියාත්මක වූ යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි කජු වගා බිම් අක්කර 30000 ක් පමණ විනාශ විය. එහෙත් වර්ෂ 2010 සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩසටහන් යටතේ වර්ෂයකට අක්කර 7000 කට අධික ඉඩම් ප්‍රමාණයක් කජු වගාවට නැඹුරු කරවීමට සමත්විය.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ හා බීජ කජු වගාව වර්ෂයකට අක්කර 4500 බැගින් ඉදිරි වසර 03 තුල ක්‍රියාත්මක කරනු ඇත. තවද, පිරිස් බලය වැඩි ස්ථාන වශයෙන් ගැනෙන හමුදා කඳවුරු,බන්ධනාගාර,පොලිසිය සහ පූජාභූමි වැනි ස්ථානවල අතිරික්ත වශයෙන් තිබෙන ඉඩම්වල සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වර්ෂයකට වගා කිරීමට නියමිත අක්කර 4500 න් අක්කර 750 පමණ මේ යටතේ වගා කිරීමට සැලසුම්කර ඇත. සහනාධාර වැඩසටහන යටතේ ගෙවතු වගාව වශයෙන් වර්ෂයකට අක්කර 1500 ක් පමණ වගා කිරීමට ද සැලසුම්කර ඇත.

## 1.2 වගා පුනරුත්ථාපනය

සංස්ථා වතුයායන් වල නව වගාව හා පැරණි වගා පුනරුත්ථාපනය කිරීම 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී.මේ යටතේ උතුරු පළාතේ කොන්ඩච්චි වතුයාය, නැගෙනහිර පළාතේ මාණ්කර්නි වතුයාය සංවර්ධනය හා පුනරුත්ථාපන කටයුතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ආරම්භ කරන ලදී. කොණ්ඩච්චි වතුයායේ අක්කර 2000 ක්, තිරියාය අක්කර 500 ක් සහ මඩු අක්කර 500 ක් පමණ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් යටතේ වගාකිරීමට සැළසුම් කර ඇත.

## 1.3 නව වගාව

පෞද්ගලික, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් හිමියන් සතු කජු වගාවන් වල නව වගාවද වාර්ෂිකව අක්කර 500 පමණ සිදු කෙරෙන අතර, ඉදිරි වසර තුන තුල මෙම වගා නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත. **ඉහත සියළු වගා වැඩසටහන් මගින් අවම වශයෙන් වාර්ෂිකව අක්කර 7000 බැගින් කජු වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.**

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 10 කින් සමන්විත ව්‍යාප්ති සේවා ජාලයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක 18 ක කජු වගා සංවර්ධන කටයුතු මෙමගින් ආවරණය කරනු ලබයි.

## 02. කජු වගා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය අක්කර 142608 ක් පමණ වන අතර, මින් 88% ක් පමණ කුඩා ඉඩම් හිමියන් වේ. බහුතරයක් ඉඩම්වල බීජ කජු ගස් වගාකර ඇති අතර, සංස්ථා වතුයායන් වල මෙන්ම මෙම ඉඩම්වලද කජු ගස් වල වයස අවුරුදු 20- 35 පමණ වන අතර, එක් ගසකින් ලෙලිකජු කිලෝ ග්‍රෑම් 3-5 ක් අතර ප්‍රමාණයක් ලැබේ. වැඩි දියුණු කරනලද නව කජු ප්‍රභේදවලින් සමන්විත කජු වගාවන් ඇති වියට්නාමය, ඉන්දියාව වැනි රටවල ගසකින් කිලෝ ග්‍රෑම් 10-15 ත් අතර අස්වැන්නක් ලැබේ. මේ අනුව වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරයි.



`

## 2.1 නව ප්‍රභේද හඳුන්වාදීම

මේ අනුව වැඩි අස්වැන්නක් ලබාදෙන වැඩිදියුණු කල නව ප්‍රභේද 08 ක් සංස්ථාව විසින් ගොවීන්වෙත හඳුන්වා දී ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලිකළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදුකෙරෙන අතර, WUCC 1 WUCC 5, WUCC 8, WUCC 9, WUCC 13, WUCC 19, WUCC 21, WUCC 23 යන ප්‍රභේද 08 එළුවන්කුලම, විලච්චිය, නාලන්ද, මහඔය, සුදුවතුර ආර හා ඔයාමඩුව යන වතුයායන් හා ශාක අභිජනන මධ්‍යස්ථානවල වගා කර ඇත.මෙම මව්ශාක වලින් අංකුර ලබාගෙන දිවයිනේ විවිධ දේශගුණික කලාපවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව නව ප්‍රභේද 02 බැගින් හඳුන්වාදීමට කටයුතු කරන අතර, මෙමගින් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න කිලෝ ග්‍රෑම් 1000 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

## 2.2 ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය

ඉතා අඩු අස්වැන්නක් ලබාදෙන බීජ කජු ගස් ඉවත්කර නැවත වගාව සිදුකිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් වාර්ෂිකව යොමු කරනු ලැබේ. ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (Good Agricultural Practices) කජු වගාවේ අස්වනු ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ජාතික වැවිළි කලමනාකරණ ආයතනයේ සහභාගීත්වය මත ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් වාර්ෂිකව සිදුකරනු ලැබේ. මෙය ඉදිරි වර්ෂ තුන තුලදීද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. දෘෂ්‍ය මාධ්‍ය මේ සඳහා උපයෝගී කරගනු ලැබේ. කජු ගස්වල මල් හටගන්නා කාලය තුල අධික වර්ෂාපතනය පැවතීම නිසා දළුමැරීමේ රෝගය ව්‍යාප්ත වේ.

මේ නිසා කජු අස්වැන්න 30%-40% ත් අතර ප්‍රමාණයකින් අඩුවේ. මේ සඳහා කුඩා ඉඩම් හිමියන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත.පරිණත කජු වගාවන් තුල ඇති කඳපණු හානිය මර්ධනය කිරීම සඳහා පර්යේෂණ අංශ සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මෙය ඉදිරි වර්ෂ තුන තුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## 2.3 මධ්‍යම පැළ තවාන්

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් මිහින්තලේ, දඹුල්ල, කමන්දළුව වතුයාය, අළුත්තරම, කුඹුක්කන, හාඩි වතුයාය හා චන්ද්‍රිකාවැව යන ස්ථාන වල ස්ථාපිත කර ඇත. මෙම තවාන් මගින් නව ප්‍රභේද වලින් සමන්විත ඉහළ ගුණාත්මයෙන් යුක්ත බද්ධ පැළ සංස්ථා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කරනු ලැබේ. වාර්ෂිකව බද්ධ පැළ 300000 ක් නිෂ්පාදනය කරන අතර, ඉදිරි වර්ෂ 03 තුලදීද වසරකට පැළ 350000 ක් බැගින් නිපදවීම අරමුණු කර ඇත. පැළ නිෂ්පාදනයේදී නව තාක්ෂණය භාවිතය වැඩිදියුණු කෙරෙනු ඇත.

## 03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ නිපදවන කජු මදවල රසවත් බව, විශාලත්වය හා ආවේණික වර්ණයෙන් යුක්ත වීම නිසා ලෝක වෙළඳපොල තුල අධික ඉල්ලුමක් ඇතිවී ඇත. එහෙත් වාර්ෂිකව නිෂ්පාදනය වන ලෙලිකජු මෙට්‍රික් ටොන් 10000-12000 ක පමණ වාර්ෂික අස්වැන්න මගින් මෙම අපනයන ධාරිතාවය ක්ෂණිකව ඉහළ නැංවීම දුෂ්කර වී ඇත. දේශීය මද පරිභෝජනයද ඉහළ ගොස් ඇත.

මීට අමතරව කජු මද කිලෝවක නිෂ්පාදන වියදම ඉහළයාම නිසා කජු මද කිලෝවක මිල රු. 2500/- ත් රු. 3500/- ත් අතර පරාසයක පවතී. මෙම කරුණු සැළකිල්ලට ගෙන කජුමද නිෂ්පාදනවල ගුණාත්මය හා ලාභය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

## 3.1 ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය

සංස්ථාව විසින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රමිතිකරණය, අගය එකතු කිරීම හා ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද (Good Manufacturing Practices) භාවිතයෙන් නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය, නව තාක්ෂණය සහිතව පිරිසැකසුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම, අඩු වියදම් විජලීකරණ යන්ත්‍ර භාවිතය හා නව ඇසුරුම් ක්‍රම හා නව නිෂ්පාදන සඳහා ව්‍යවසායකයන් උනන්දු කිරීම සිදුකෙරේ. මේ සඳහා නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගනු ලැබේ.

## 3.2 පුහුණු වැඩසටහන්

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන් දක්වා ඉහළ නැංවීමට සංස්ථාවේ දායකත්වය ලබාදුන් අතර, වාර්ෂිකව පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් 50 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම ඉදිරි වසර 03 තුල අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

පිරිසැකසුම් කර්මාන්තය ආරම්භ කරන්නන් හට අවශ්‍ය විදුලිබලයෙන් ක්‍රියාකරන කැපීමේ යන්ත්‍ර (Shelling machine) හා විජලීකරණ යන්ත්‍ර (Ovens) සංස්ථාවේ මැදිහත්වීම මත පහසුමිලට ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාක්මක කෙරෙන අතර, මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

## 3.3 කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජු මද මිලදී ගැනීම

සංස්ථා වතුයායන් වලින් ලැබෙන ලෙලි කජු අස්වැන්නට අමතරව පිරිසැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩව වාර්ෂික නිෂ්පාදනය සිදුකිරීම සඳහා අවශ්‍ය කජු මද කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් මිලදී ගැනීම පසුගිය වසර තුලදී සිදුකරන ලදී. වෙළඳපොල තරඟකාරී තත්ත්වයන්ට මුහුණදීම සහ පිරිවැය අවමකිරීමේ පරමාර්ථයෙන් ගොවීන්ගෙන් ලෙලිකජු මිලදීගැනීම වෙනුවට කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන්ගෙන් කජුමද මිලදී ගැනීම සිදුකරන ලදී. ඉදිරි වර්ෂ 3 තුලදීද කුඩා පරිමාණ පිරිසැකසුම් කරුවන්ගෙන් කජු මද මිලට ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 3.4 කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය

කජු අස්වැන්න මගින් ප්‍රධාන වශයෙන්ම ලෙලිකජු වෙන්කරගන්නා අතර කජු පුහුලන් ප්‍රයෝජනයට නොගෙන අපතේ යයි. මේ අනුව වාර්ෂිකව කජු පුහුලන් ටොන් 10000කට අධික ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන විනාශ වී යයි. මෙම කජු පුහුලන් භාවිතකර Non Alcoholic Beverages ජෑම්, කෝඩියල් වැනි අතුරු නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි.

## 4.0 මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම

### 4.1 මනව සම්පත් පුහුණු කිරීම හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තරාතිරම්වල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකර ඇත. මෙ මගින් කාර්ය ඵලදායිතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසෙන අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඉඩප්‍රස්ථා සැලසේ. මෙම පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂ 03 තුල අඛණ්ඩව සිදුකිරීමට සැලසුම් කර ඇත.

### 4.2 කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය හා කාර්ය සාධන ඇගයීම

සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සඳහා පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර ලබාදී ඇත. ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහිතව සන්නිවේදන කටයුතු නවීකරණය කර ඇත. වර්තමාන සංවර්ධන ක්‍රියාවලියට අනුරූප වන පරිදි සංස්ථාවේ කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම සිදුකල අතර, ඒ අනුව බඳවාගැනීමේ හා උසස් වීමේ පටිපාටිය සංශෝධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත. මෙමගින් කාර්ය මණ්ඩල ව්‍යුහය තුල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලිකාංග සහිතව සංස්ථාවේ ඉදිරි වසර කිහිපය තුල අභියෝග වලට මුහුණදීම සඳහා මෙම ව්‍යුහාත්මක වෙනස්කම් උපයෝගී කරගනු ඇත. සියළුම තරාතිරම්වල කාර්ය සාධනය ඇගයීම් සිදුකිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016.12.31 දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය

| 2015.12.31 | | සටහන | රු. | රු. |
|---|---|---|---|---|
| රු. | **වත්කම්** | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | |
| 110,208,071.46 | දේපළ පිරියත හා උපකරණ | 01 | 100,868,528.94 | |
| 31,442,182.70 | ඵල දරණ වගා නඩත්තු වියදම් | 02 | 29,302,731.09 | |
| 33,242,774.25 | ඵල නොදරණ වගා නඩත්තු වියදම් | 03 | 41,362,272.10 | - |
| 806,139.73 | අනෙකුත් කුඩා ව්‍යාපෘති | 04 | 949,324.48 | |
| 175,699,168.14 | **මුළු ජංගම නොවන වත්කම්** | | | 172,482,856.61 |
| | **ජංගම වත්කම්** | | | |
| 30,130,806.66 | තොග | 05 | 28,916,492.36 | |
| 24,410,542.89 | වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ | 06 | 20,797,900.64 | |
| 4,287,395.21 | තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 07 | 4,840,932.10 | |
| 38,846,405.43 | මුදල් සහ මුදල් සමාන දෑ | 08 | 7,874,272.09 | |
| 97,675,150.19 | මුළු ජංගම වත්කම් | | | 62,429,597.19 |
| **273,374,318.33** | **මුළු වත්කම්** | | | **234,912,453.80** |
| | ස්කන්ධ සහ වගකීම් | | | |
| | ස්කන්ධ | | | |
| 40,000,000.00 | මූලික ප්‍රාග්ධනය | | 40,000,000.00 | |
| 114,881,471.56 | රාජ්‍ය ප්‍රදාන | | 123,860,520.72 | - |
| 18,916,912.73 | අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන | 09 | 18,529,864.26 | |
| 17,441,846.85 | ප්‍රාග්ධන සංචිත | 10 | 17,441,846.85 | |
| 8,550,232.37 | ලාභ අලාභ ගිණුම | | (27,975,179.12) | |
| 199,790,463.51 | **මුළු ස්කන්ධ** | | | 171,857,052.71 |
| | ජංගම නොවන වගකීම් | | | |
| 52,470,630.13 | පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් | | 40,060,261.50 | |
| 52,470,630.13 | **මුළු ජංගම නොවන වගකීම්** | | 40,060,261.50 | |
| | ජංගම වගකීම් | | | |
| 21,113,224.69 | වෙළෙඳ ණයහිමියෝ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ | 11 | 22,995,139.54 | |
| 21,113,224.69 | **මුළු ජංගම වගකීම්** | | | 63,055,401.04 |
| **273,374,318.33** | **මුළු ස්කන්ධ සහ වගකීම්** | | | **234,912,453.75** |

**ධම්සිරි බණ්ඩාර කරුණාරත්න**
**සභාපති**

**මිරිඇල්ල ඩබ්.එම්. බණ්ඩාරතිලක**
**උප සභාපති**

**එම්.ටී.එස්.කේ. පීරිස් සහකාර**
**සාමාන්‍යාධිකාරි-මුදල්**



`

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

**පදනම් කරගත් ගිණුම් ප්‍රතිපත්ති - 2016**

01. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මත ගිණුම් පිළියෙල කර ඇත.

02. ස්ථාවර වත්කම් සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය කරන ලදි. වර්ෂය තුල මිලට ගත් වත්කම් ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කරන ලදි. වර්ෂය තුල නිම කරන ලද ගොඩනැගිළි නිම කරන ලද දිනය පදනම් කරගැනීමෙන් නොව මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන ලදි.

ක්ෂය කිරීමේ ප්‍රතිශත පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| මෝටර් වාහන | 20% |
| යන්ත්‍ර සූත්‍ර | 10% |
| මෙවලම් සහ උපකරණ | 10% |
| කාර්යාලීය උපකරණ | 10% |
| නළ ලිං / වගා ලිං | 10% |
| ලී බඩු උපකරණ සහ සවිකිරීම් | 06% |
| ස්ථිර ගොඩනැගිලි | 03% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 33 1/3 % |

03. දේපල පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත් වත්කම් පිරිවැයට ගිණුම්ගත කර ඇත. දේපල පිරියත සහ උපකරණ වල අගය ප්‍රත්‍යාගණන වටිනාකම මත සමුච්චිත ක්ෂය හා හානිකරන ලද අලාබ අඩුකර දක්වා ඇත.

04. පහත සඳහන් පදනම මත තොග ගණනය කරන ලදි.

| | |
|---|---|
| කජු මද | ; ශුද්ධ විකුණුම් මිලෙන් |
| කජු ඇට | ; සහතික කළ වෙනස් වන මිල/වෙළෙඳ පොළ මිල |
| ගව සහ බැටළු | ; ඒ ඒ පලාත්වල වෙළෙඳ මිල/ජීව බර අනුව |
| පොල් | ; ශුද්ධ විකුණුම් මිල |
| අනෙකුත් සියළුම තොග | ; පිරිවැයට ගණනය කරන ලදි. |



`

05. ප්‍රධාන කාර්යාලීය වියදම් පිරිවැය මධ්‍යස්ථාන අතර එහි අන්තර්ගත මුළු වැටුප් වියදමට අදාලව බෙදා හරින ලදී.

06. වතුයායන්හි සාමාන්‍ය වියදම් ඵල දරණ සහ ඵල නොදරණ ප්‍රදේශ, පැලතවාන් සහ සත්වපාලනය අතර බෙදීම එම ප්‍රදේශ සඳහා වැයවූ සත්‍ය කම්කරු දින ගණනේ අනුපාතය අනුව බෙදා හරින ලදී.

07. මේරූ ප්‍රදේශ වල ක්‍රමක්ෂය කිරීම වර්ෂයකට 5% බැගින් ගණනය කරන ලදි.

08. බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම මුළු ණය ගැතියන්ගෙන් 3.53% බැගින් ගණනය කර ඇත. වෙන් කිරීම් ගිණුමේ වෙනස වර්ෂය තුල බොල් ණය කපා හැරීම සඳහා මාරු කරන ලදි.

09. පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම පාරිතෝෂිත දීමනා පනතේ සඳහන් පරිදි සේවය කරන ලද සම්පූර්ණ වර්ෂ ගණනට අනුව ගණනය කරන ලදි. පාරිතෝෂික හිමිකම් ලැබීම සඳහා පනතේ සඳහන් අවම සේවා කාලය ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණවූ අයගේ සේවා පිරිවැය ආදායම් ගිණුමට හර කර ඇත.

10 ලැබූ හා ලැබිය යුතු දැවල වටිනාකම මත ආදායම ගිණුම්ගත කර ඇත.

පහත සඳහන් දෑ සැලකිල්ලට ගෙන භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනාගෙන ඇත.

- ආයතනය අවදානම හා ප්‍රතිලාභ යන දෙකම ගැණුම්කරුට ලබාදේ.
- ආයතන කළමනාකාරිත්වයේ මැදිහත්වීමක් විකුණන භාණ්ඩවල හිමිකාරිත්වයට හෝ කාර්යක්ෂම පාලනයක් තබා ගැනීම සඳහා මැදිහත් නොවේ.
- ආදායම විශ්වාසනීය ලෙස හඳුනාගත හැකි වීම.
- ගණුදෙනු හා අදාල ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලායා හැක
- ගණුදෙනුවට අදාල වු හෝ අදාල විය හැකි පිරිවැය විශ්වාසනීය ලෙස අගය කිරීම.



`

11. ප්‍රාග්ධන වත්කම් හි ක්ෂයවීම් හා ක්‍රමක්ෂය ලෙස ගිණුම් පොත්වලට ඇතුලත් කර ඇති සත්‍ය වටිනාකම්, අදාල ප්‍රාග්ධන වත්කම්වලින් කපා හැරීමෙන් අනතුරුව ඊට සමාන වටිනාකමක් ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉවත් කර ගිණුම්පොත් වල ආදායමක් ලෙස හදුනාගනුලැබේ.

12. මෝටර් වාහන ප්‍රත්‍යා ගනය 2009.01.01 දින සිට බලපැවත්වන දිනය ලෙස නිශ්චය කරන අතර, පිළිගත් රාජ්‍ය ආයතනයක කාර්මික ඉංජිනේරුවරයෙකුගේ මූලිකත්වයෙන් යුතු ස්වාධින කොමිසමක් මගින් කරන ලදි.

13. බද්ධ පැළ සහ බිජ පැළ නිෂ්පාදනයට අදාල පරිපාලන වියදම් සේවා සහ වානිජ අංශ අතර, නිෂ්පාදිත සත්‍ය පැළ හා බෙදා හරින ලද පැළ පදනම් කර ගෙන කර ඇත.

<u>ශ්‍රී ලංකා කජු සංස්ථාව</u>

<u>ගිණුම් සටහන්</u>

(1). ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල මූල්‍ය ප්‍රකාශන 2017.02.22 දින අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කරන ලදී.

(2). <u>ව්‍යාපාර ස්වභාවය සහ ප්‍රධාන ක්‍රියාකාරකම්</u>

ශ්‍රී ලංකා කජු සංස්ථාව කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතුවල යෙදෙන අතර එහි ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් සඳහන් කර ඇත.

- වතුයායන්වල කජු පැළ වගා කිරීම සහ ලෙලි කජු නිෂ්පාදනය.
- සංස්ථා බීජ උද්‍යානවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය.
- සංස්ථා වානිජ පැළ තවාන්වල බද්ධ සහ බීජ පැළ නිෂ්පාදනය.
- කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා දිස්ත්‍රික්ක 18 ක් ආවරණය කරමින් ගොවි ඉඩම් සඳහා සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- පිරිසැකසුම් මධ්‍යස්ථානවල කජු මද නිපදවීම සහ අගය එකතු කිරීම.
- කජු පුහුලන් භාවිතයෙන් වයින් නිෂ්පාදනය.
- අගය එකතු කරන ලද කජු නිෂ්පාදන සංස්ථා අලෙවිසැල්වල, වරලත් අලෙවිසැල්වල සහ වෙනත් ආයතනවල අලෙවි කිරීම.
- කජු වගාව සහ පිරිසැකසුම් තාක්ෂණය සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම සහ පුහුණුව ලබාදීම.

(3). සංස්ථාවේ හිටපු අලෙවි හා පිරිසැකසුම් කළමනාකරු විසින් ඔහුව අනුමිත ලෙස සේවයෙන් පහ කර ඇති බව නිමිත්ත ලෙස ගෙන ඒ සම්බන්ධයෙන් වන්දියක් ඉල්ලුම් කරමින් සංස්ථාවට එරෙහිව කොළඹ 01, කම්කරු විනිශ්චයාධිකාරයේ නඩු පවරා ඇත. වාර්තා කරන දිනට එම නඩුවේ අවසන් තීන්දුවක් ප්‍රකාශයට පත්කර නොමැති අතර සාධාරණ ඇස්තමේන්තුවක් සපයාගත නොහැකි වීම නිසා එම වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ගිණුම්පොත්වල සිදුකර නැත.

(4). මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පදනම්කර ගත් මිනුම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ අදාල මිනුම් ගිණුම් සටහන් වල අවශ්‍ය අවස්ථාවන් වලදී අනාවරණය කොට ඇත.

(5). කාර්ය මණ්ඩල පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් ගණනය කිරීමට ආයුගණක තක්සේරු වටිනාකමක් ලබාගෙන නොමැති අතර ඊට හේතු වී ඇත්තේ ඒ සඳහා අවශ්‍ය උපදේශාත්මක සේවාවන් ලබාගැනීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැති වීමයි. ඒ අනුව වාර්තා කරන දිනට කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ වැටුප් හා ඔවුන්ගේ සේවාකාලය මත පදනම්ව (පවත්නා නීති රීති වලට අනුව) පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත.



`

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

**සටහන් 01**

**දේපල පිරියත සහ උපකරණ ;**

| විස්තරය | පිරිවැය/ප්‍රත්‍යාගණන අගය 2016.01.01. (රු.) | අදාල වසරේ වත්කම් එකතුවීම් / ප්‍රත්‍යාගණනය (රු.) | අදාල වසරේ වත්කම් ඉවත්කිරීම් /විකුණුම් (රු.) | වත්කමේ වර්තමාන පිරිවැය / ප්‍රත්‍යා ගණන වටිනාකම (රු.) | 2016.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.) | ලියා හරින ලද අගය 2016.12.31 දිනට (රු.) |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 23,536,722.37 | 2,250,000.00 | - | 25,786,722.37 | - | 25,786,722.37 |
| ස්ථාවර ගොඩනැගිලි | 44,305,645.15 | 608,792.00 | - | 44,914,437.15 | 17,341,445.36 | 27,572,991.79 |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 243,710.00 | 196,701.00 | | 440,411.00 | 192,383.08 | 248,027.92 |
| වාහන | 98,603,365.84 | 1,384,065.00 | - | 99,987,430.84 | 66,457,970.79 | 33,529,460.05 |
| යන්ත්‍ර සූත්‍ර | 15,159,406.98 | 1,266,090.00 | - | 16,425,496.98 | 11,274,509.94 | 5,150,987.04 |
| මෙවලම් හා උපකරණ | 8,179,119.92 | 856,280.82 | - | 9,035,400.74 | 7,347,903.16 | 1,687,497.58 |
| කාර්යාලීය උපකරණ | 10,549,458.99 | 374,862.50 | - | 10,924,321.49 | 8,597,515.18 | 2,326,806.31 |
| ලී බඩු හා සවිකිරීම් | 6,887,972.32 | 209,261.00 | - | 7,097,233.32 | 4,441,946.49 | 2,655,286.83 |
| නළ ළිං | 826,682.00 | 131,701.50 | - | 958,383.50 | 526,155.49 | 432,228.01 |
| වගා ළිං | 1,110,755.66 | 69,750.74 | - | 1,180,506.40 | 310,809.98 | 869,696.42 |
| වැව් | 608,824.62 | - | - | 608,824.62 | - | 608,824.62 |
| | **210,011,663.85** | **7,347,504.56** | **-** | **217,359,168.41** | **116,490,639.47** | **100,868,528.94** |



`

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

**<u>සටහන් 02</u>**

| | | |
|---|---|---|
| **එල දරණ වගාව - කජු** | **(සටහන 2 අ)** | 27,290,932.37 |
| **-** | **(සටහන 2 ආ)** | 2,011,798.72 |
| **පොල්** | | |
| | | **29,302,731.09** |

**<u>(සටහන 2 අ)</u>**

එල දරණ වගාව - කජු

| වතුයාය | පිරිවැය 2016.01.01 (රු.) | 2016.12.31 දිනට සමුච්චිත ක්ෂය | ලියා හරින ලද අගය 2016.12.31 (රු.) |
|---|---|---|---|
| හාඩි වතුයාය | 2,736,310.00 | 1,797,539.35 | 938,770.65 |
| කමන්දළුව වතුයාය | 14,708,944.94 | 11,007,531.17 | 3,701,413.77 |
| පුත්තලම වතුයාය | 30,069,888.71 | 19,590,822.69 | 10,479,066.02 |
| එළුවන්කුලම බීජ උද්‍යානය | 13,933,185.28 | 9,568,897.08 | 4,364,288.20 |
| විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය | 655,569.86 | 163,184.29 | 492,385.57 |
| ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 5,806,871.57 | 1,116,210.19 | 4,690,661.38 |
| මහඔය ශාක අභිජනන මධ්‍යස්ථානය | 1,150,848.05 | 172,627.20 | 978,220.85 |
| මොණරාගල ශාක අභිජනන මධ්‍යස්ථානය | 1,936,618.75 | 290,492.82 | 1,646,125.93 |
| | **70,998,237.16** | **43,707,304.79** | **27,290,932.37** |

**<u>සටහන් 02 (ආ)</u>**

එල දරණ වගාව -පොල්

| වතුයාය | පිරිවැය 2016.01.01 (රු.) | 2016.12.31 දිනට සමුච්චිත ක්ෂය | ලියා හරින ලද අගය 2016.12.31 (රු.) |
|---|---|---|---|
| හාඩි වතුයාය | 1,369,822.51 | 547,929.04 | 821,893.47 |
| කමන්දළුව වතුයාය | 2,437,612.22 | 1,323,305.04 | 1,114,307.18 |
| පුත්තලම වතුයාය | 431,998.76 | 356,400.69 | 75,598.07 |
| | **4,239,433.49** | **2,227,634.77** | **2,011,798.72** |



`

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

**සටහන් 03**

| | | |
|---|---|---|
| ඵල නොදරණ වගාව - කජු | (සටහන 3 අ) | 36,419,064.76 |
| - පොල් | (සටහන 3 ආ) | 4,943,207.34 |
| | | **41,362,272.10** |

**සටහන් 03 (අ)**

**නොමේරූ ප්‍රදේශ: (කජු)**

**වතුයාය**

| | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|
| හාඩි වතුයාය | 2,387,604.09 |
| කමන්දළුව වතුයාය | 3,466,516.96 |
| පුත්තලම වතුයාය | 3,831,322.18 |
| එළුවන්කුලම බීජ උද්‍යානය | 748,390.43 |
| මාන්කර්නි වතුයාය | 1,315,572.56 |
| ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය | 152,382.00 |
| මහඔය බීජ උද්‍යානය | 520,906.45 |
| මොණරාගල බීජ උද්‍යානය | 345,338.70 |
| පර්යේෂණ හා සංවර්ධන | 1,598,496.77 |
| නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය | 135,360.40 |
| ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | 10,078,258.69 |
| විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය | 21,783.98 |
| කොණ්ඩච්චි ශාක අභිජනන මධ්‍යස්ථානය | 11,817,131.55 |
| | **36,419,064.76** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

**සටහන් 03 (ආ)**

**එල නොදරණ වගාව - පොල්**

| වතුයාය | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|
| හාඩි වතුයාය | 2,099,344.16 |
| කමන්දළුව වතුයාය | 995,672.68 |
| පුත්තලම වතුයාය | 630,182.49 |
| ඔයාමඩුව ශාබ අභිජනන මධ්‍යස්ථානය | 1,218,008.01 |
| | **4,943,207.34** |

**සටහන් 04**

**අනෙකුත් කුඩා ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|
| තේක්ක පැල ව්‍යාපෘතිය | 482,874.09 |
| තල ව්‍යාපෘතිය | 40,000.00 |
| පැපොල් ව්‍යාපෘතිය | 368,594.66 |
| කෙසෙල් හා දෙහි ඇසුරුම් ද්‍රව්‍ය ව්‍යාපෘතිය | 10,800.00 |
| තිබ්බටු ව්‍යාපෘතිය | 47,055.73 |
| | **949,324.48** |

**සටහන් 05**

**ජංගම වත්කම්**

| තොග | |
|---|---|
| විවිධ | 3,268,416.56 |
| වයින් සහ කුතුල් පැණි | 188,117.27 |
| කජු මද | 12,411,594.01 |
| කජු ඇට | 8,915,360.00 |
| පැළ | 2,708,562.36 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 1,404,454.16 |
| පොල් | 19,988.00 |
| | **28,916,492.36** |

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

**සටහන් 06**
**වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ**

| | | |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 2,314,600.60 | |
| අඩු කළා - බොල්ණය වෙන් කිරීම | 81,706.00 | 2,232,894.60 |
| විවිධ ණයගැතියෝ | 20,208,598.04 | |
| හානි වීම් වලින් වන අලාභ | 1,643,592.00 | 18,565,006.04 |
| | | **20,797,900.64** |

**සටහන් 07**
**තැන්පතු අත්තිකාරම් සහ පෙර ගෙවුම්**

| | |
|---|---|
| අත්තිකාරම් | 16,500.00 |
| පෙර ගෙවුම් | 170,838.60 |
| **තැන්පතු** | 4,653,593.50 |
| | **4,840,932.10** |

**සටහන් 08**

| | |
|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ | |
| මුදල් - මාර්ගස්ථ | 22,800.00 |
| මුදල් - අත ඉතිරි හා බැංකු ඉතිරි | 7,851,472.04 |
| | **7,874,272.04** |

**සටහන් 09**

**අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුනු**

**ප්‍රදාන**

| | |
|---|---|
| උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය | 6,569,892.91 |
| අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය | 1,612,451.80 |
| සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 10,347,519.55 |
| **එකතුව** | **18,529,864.26** |

## ශ්‍රී ලංකා කපු සංස්ථාව

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ශේෂ පත්‍රයට අදාල සටහන්

**සටහන් 10**

**ප්‍රාග්ධන සංචිත**

| | |
|---|---:|
| ප්‍රත්‍යාගණන සංචිතය - වාහන | 16,929,116.63 |
| අනෙකුත් ප්‍රාග්ධන සංචිත | 512,730.22 |
| | **17,441,846.85** |

**සටහන් 11**

**ජංගම වගකීම්**

| | |
|---|---:|
| **විවිධ ණයහිමියෝ** | 16,412,779.70 |
| **උපචිත වියදම්** | 6,582,359.84 |
| **එකතුව** | **22,995,139.54** |

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**

**වාණිජ අංශය**

**2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ලාභ අලාභ ගිණුම**

| 2015.12.31 (රු.) | | | 2016.12.31 (රු.) |
|---|---|---|---|
| | **විකුණුම් / පිරිවැටුම** | | |
| 67,707,424.80 | | කජු මද | 86,194,216.09 |
| 3,004,850.00 | | බීජ කජු ඇට | 2,121,515.00 |
| 3,157,500.00 | | කජු පැල | 5,210,800.00 |
| 1,481,898.19 | | පොල් | 1,425,600.50 |
| (55,122.80) | | ආපසු එවුම් | (46,496.00) |
| **75,296,550.19** | | ශුද්ධ විකුණුම් | **94,905,635.59** |
| | **අඩුකලා:** | **විකුණුම් පිරිවැය** | |
| 1,188,845.97 | | තොග අඩු/ වැඩිවීම් | (1,868,861.98) |
| 166,617.83 | | තවාන් වියදම් | 741,976.96 |
| 22,998,006.00 | | කජු මද නිෂ්පාදන පිරිවැය / පොදුකාර්ය | 38,613,263.18 |
| 21,355,753.45 | | එල දරණ වගා නඩත්තු වියදම් | 24,383,333.74 |
| 9,345,547.13 | | එල දරණ වගා සෘජු වියදම් | 6,777,772.26 |
| 55,054,770.38 | **මුළු විකුණුම් පිරිවැය** | | 68,647,484.16 |
| **20,241,779.81** | දළ ලාභය | | **26,258,151.43** |
| | **අඩුකලා:** | **අනෙකුත් වියදම්** | |
| 16,102,968.44 | | පරිපාලන වියදම් (පිරිසැකසුම් සහ තවාන්) | 19,992,240.51 |
| 16,102,968.44 | | | 19,992,240.51 |
| **4,138,811.37** | ලාභ (අලාභ) ක්‍රමක්ෂය කිරීමට පෙර | | **6,265,910.92** |
| 3,283,050.99 | | ක්‍රමක්ෂය | 3,351,365.57 |
| **855,760.38** | ලාභ (අලාභ) ක්‍රමක්ෂය කිරීමට පසු | | **2,914,545.35** |
| 227,361.39 | | ලාභ / (අලාභ) වයින් සහ කිතුල් පැණි | 352,698.68 |
| 33,500.00 | | ලාභ / (අලාභ) පිරිසැකසුම් උපකරණ | 105,000.00 |
| (152,344.97) | | ලාභ/ (අලාභ) පැපොල් ව්‍යාපෘතිය | (204,645.68) |
| - | | ලාභ / (අලාභ) පුහුණු වැඩ සටහන් | 58,407.55 |
| (1,266,682.36) | | ලාභ / (අලාභ) සත්ව පාලනය | - |
| **(302,405.56)** | **ක්‍රියාන්විතයෙන් ලත් ශුද්ධ ලාභ / (අලාභ)** | | **3,226,005.90** |
| - | | අනෙකුත් ආදායම් | - |
| 27,798,000.00 | | රාජ්‍ය ප්‍රදාන පුනරාවර්තන | 16,922,573.08 |
| 10,168,605.39 | | ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය | - |
| - | | ලාභ/ (අලාභ)-රක්ෂණ වන්දි | 8,752,506.76 |
| 2,451,182.75 | | පොලී ආදායම් | 1,563,437.62 |
| 2,512,401.14 | | වෙනත් ආදායම් | 17,596,700.93 |
| 2,291,036.81 | | ක්‍රමක්ෂය-වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන | 2,717,036.82 |
| **45,221,226.09** | | මුළු අනෙකුත් ආදායම් | **47,552,255.21** |
| | අනෙකුත් වියදම් | | |
| 27,897,829.00 | | පරිපාලන වියදම් (ප්‍රධාන කාර්යාලය) | 19,148,189.25 |
| **17,020,991.53** | ශුද්ධ ලාභය | | **31,630,071.86** |

**ශ්‍රී ලංකා කජු සංස්ථාව**
**සේවා අංශය**

**2016.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම**

| **2015.12.31** (රු). | | | | (රු). |
|---|---|---|---|---|
| | **ආදායම** | | | |
| 23,382,225.18 | රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධන | ප්‍රවර්තන වසර | | 21,870,362.74 |
| 2,318,239.65 | | ක්‍රමක්ෂය - අනෙකුත් වත්කම් | | 2,760,588.10 |
| 3,195,000.00 | | කැබ්රථ 03 | | 3,834,000.00 |
| 38,302,000.00 | | පුනරාවර්තන | | 31,077,426.92 |
| | වෙනත් ආදායම් | | | |
| | | අතිරික්ත වෙන්කිරීම් සඳහා | | |
| - | | ගැලපුම් | 220,800.00 | |
| 111,620.00 | | ව්‍යාප්ති සේවා | 2,056.42 | |
| 26,455.00 | | පර්යේෂණ හා සංවර්ධන | 352,400.00 | 575,256.42 |
| **67,335,539.83** | **මුළු ආදායම** | | | **60,117,634.18** |
| | **අඩු කළා :-** | | | |
| | **වියදම්** | | | |
| 38,438,172.65 | ප්‍රධාන කාර්යාලය | | 35,164,655.48 | |
| 23,382,225.18 | ප්‍රාග්ධන දීමනා යටතේ | | 21,870,362.74 | |
| 51,705,959.87 | ව්‍යාප්ති සේවා | | 60,540,353.94 | |
| 12,114,885.83 | මධ්‍යම පැළ තාවන් | | 2,816,646.19 | |
| 3,891,016.26 | පර්යේෂණ හා සංවර්ධන | | 4,087,590.92 | |
| 569,763.68 | ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | | 918,419.76 | |
| 1,982,549.66 | ඔයාමඩුව ශාඛ අභිජනන මධ්‍යස්ථානය | | 2,875,088.50 | |
| 132,084,573.13 | **මුළු වියදම** | | | 128,273,117.53 |
| | **වර්ෂය තුල ආදායම ඉක්මවූ වියදම** | | | |
| **(64,749,033.30)** | **අවසාන ඒකාබද්ධ ලාභ අලාභ ගිණුමට මාරු කලා** | | | **(68,155,483.35)** |

**ඒකාබද්ධ ගිණුම ප්‍රකාශය**

| **31.12.2015** (රු.) | **2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්පූර්ණ ආදයම් විස්තරය** | | (රු.) |
|---|---|---|---|
| 17,020,991.32 | **වානිජ අංශයෙන් ලද ශුද්ධ ලාභය** | | 31,630,071.86 |
| (64,749,033.30) | **ප්‍රවර්තන වසර සඳහා ආදායම ඉක්ම වූ වියදම - සේවා අංශය** | | (68,155,483.35) |
| **(47,728,041.98)** | | | **(36,525,411.49)** |
| 56,278,274.35 | ලාභය පහළට ගෙන ගියා | 8,550,232.37 | |
| 56,278,274.35 | | | 8,550,232.37 |
| 8,550,232.37 | ලාභය ඉදිරියට ගෙන ගියා | | (27,975,179.12) |

ශ්‍රී ලංකා කජු සංස්ථාව

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| 2015.12.31 | | **2016.12.31 දිනෙන් අවසන් වර්ෂය** | |
|---|---|---|---|
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| (47,728,041.98) | වර්ෂය තුල ඉපයූ ශුද්ධ ලාභය | | (36,525,411.49) |
| | **මුදල් චලනයන් නොවූ අයිතමයන් සඳහා ගැලපීම්** | | |
| 17,695,062.67 | කෂය වීම් | 16,687,047.08 | |
| 3,437,424.54 | ක්‍රමක්ෂය | 3,505,738.91 | |
| 12,242,906.37 | පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම | 394,830.26 | |
| 384,277.97 | බොල්ණය සඳහා ලියා හැරීම හෝ වෙන් කිරීම | 317,055.04 | |
| (5,395,119.99) | ස්ථාවර වත්කම් හුවමාරුවෙන් වූ ලාභය | - | |
| (4,773,485.40) | ලාභාලාභ ගිණුමට ප්‍රාග්ධන වියදම් ලියා හැරීම | - | |
| 21,846.87 | මෙවලම් සහ උපකරණ සොරකම් කිරීමෙන් ඇති වූ අලාභ | | |
| 1,046,491.00 | කෙරිගෙන යන ප්‍රග්ධන වැඩ ලියාහැරීම | - | |
| 237,187.85 | අනෙකුත් කුඩා ව්‍යාපෘති ලියා හැරීම | - | |
| - | පාරිතොෂික සඳහා අතිරික්ත වෙන්කිරීම් | (8,752,506.76) | |
| (226,011.65) | වෙනත් පාර්ශයයන්ගෙන් ලත් ප්‍රධාන | (387,048.47) | |
| 261,468.96 | පල දරණ වගා ගැලපුම -(හාඩි වතුයාය) | - | |
| (31,186,501.64) | ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය | (31,020,950.84) | |
| (6,254,452.45) | | | (19,255,834.78) |
| (53,982,494.43) | **කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයුම් ලාභය / පාඩුව** | | (55,781,246.27) |
| | **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| 18,581,307.76 | තොගය - (වැඩිවීම) / අඩුවීම | 1,214,314.30 | |
| 48,085.69 | ණය ගැතියෝ - (වැඩිවීම) / අඩුවීම | 3,295,587.21 | |
| 5,792,348.03 | අත්තිකාරම් සහ පෙර ගෙවුම් - (වැඩිවීම) / අඩුවීම | (553,536.89) | |
| (2,132,590.15) | ණය හිමියෝ - වැඩිවීම / (අඩුවීම) | 4,633,945.04 | |
| (1,758,747.05) | උපචිත වියදම් - වැඩිවීම / (අඩුවීම) | (2,752,030.19) | |
| 20,530,404.28 | | | 5,838,279.47 |
| (33,452,090.15) | | | (49,942,966.80) |
| (2,186,852.25) | පාරිතෝෂිත ගෙවීම් | | (4,052,692.13) |
| (35,638,942.40) | මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (53,995,658.93) |



`

**ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

| | | | |
|---|---|---|---|
| (18,969,771.51) | ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (7,347,504.56) | |
| (7,389,946.53) | නව වගා සඳහා ආයෝජනය කිරිම | (9,485,785.15) | |
| 5,395,125.95 | ස්ථාවර වත්කම් විකිණීම | - | |
| (428,733.20) | වෙනත් කුඩා ව්‍යපෘති සඳහා ආයෝජනය | (143,184.75) | |
| (21,393,325.29) | | | (16,976,474.46) |
| (57,032,267.69) | ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (70,972,133.39) |
| | **මූල්‍ය ක්‍රියාකාරම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| 35,000,000.00 | රාජ්‍ය ප්‍රදාන | | 40,000,000.00 |
| (22,032,267.69) | වර්ෂය තුලදී මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම | | (30,972,133.39) |
| 60,878,673.12 | වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ **(සටහන 01)** | | 38,846,405.43 |
| **38,846,405.43** | | | **7,874,272.04** |

| **(සටහන් 01)** | **2016.01.01** දිනට | **2016.12.31** දිනට |
|---|---|---|
| අත ඉතිරි සහ බැංකු ඉතිරි මුදල් | 38,724,327.43 | 7,851,472.04 |
| මාර්ගස්ථ මුදල් | 122,078.00 | 22,800.00 |
| | **38,846,405.43** | **7,874,272.04** |



`

## ශ්‍රී ලංකා කජු සංස්ථාව

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය

| වෙනස්වීම් | මූලික ප්‍රාග්ධනය | රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රධාන | ප්‍රාග්ධන ප්‍රධාන උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා.සං. වැඩසටහන | ප්‍රාග්ධන ප්‍රදාන අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය | ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් ප්‍රාග්ධන සංචිත | ප්‍රදාන සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | ලාභාලාභ ගිණුම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2016.12.01 දිනට ශේෂය | 40,000,000.00 | 114,881,471.56 | 6,795,904.56 | 1,612,451.80 | 16,929,116.63 | 512,730.22 | 10,508,556.37 | 8,550,232.37 | 199,790,463.51 |
| වර්ෂ තුලදී ලද ප්‍රධාන | - | 40,000,000.00 | - | - | - | - | - | - | 40,000,000.00 |
| ලාභ අලාභ ගිණුමට මාරු කිරිම | - | (31,020,950.84) | (226,011.65) | - | - | - | (161,036.82) | - | (31,407,999.31) |
| කාල පරිච්චේදය සඳහා ශුද්ධ ලාභය / අලාභය | - | - | - | - | - | - | - | (36,525,411.49) | (36,525,411.49) |
| 2016.12.31 දිනට ශේෂය | **40,000,000.00** | **123,860,520.72** | **6,569,892.91** | **1,612,451.80** | **16,929,116.63** | **512,730.22** | **10,347,519.55** | **(27,975,179.12)** | **171,857,052.71** |



`

මගේ අංකය / எனது இல. / My No. } ඒපීඑල්/සී/එස්එල්සී/1/16/එෆ්ඒ

මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 මැයි 31 දින

සභාපති

ශ්‍රී ලංකා කජු සංස්ථාව

**ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2017 මැයි 09 දින නිකුත්කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

----------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07

---------------------------------------

ප්‍රමිතයේ 08 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය සිදුකළ ආකාරය හා ප්‍රමිතයේ 31 වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ මූල්‍ය හා කළමනාකරණ අවධානම් මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

------------------------------

(i) ප්‍රමිතයේ 79 (බි) ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධන සංචිත වල ස්වභාවය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 117 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මැනීම සහ සංස්ථාව සතු ජෛව වත්කම් හඳුනාගැනීම ගිණුම්ගත කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

(iii) ප්‍රමිතයන් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් වියදම් හිලව් නොකළ යුතු වුවද ගස්ලබු ව්‍යාපෘතියේ රු.127.617 ක් වූ ආදායම් රු. 332.262 ක් වූ වියදමට හිලව් කර මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02

---

පිරිවැය වෙන වෙනම ගණනය කර තොග අගය කිරීම වෙනුවට, සියළුම නිෂ්පාදන වල සාමාන්‍ය පිරිවැය අනුව තොග අගය කර තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ රු.12.411.594 ක් වූ කජු ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ වෙළඳ පොළේ මිල සාමාන්‍ය පිරිවැයට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

---

(i) ප්‍රමිතයේ 55 වගන්තිය ප්‍රකාරව වත්කම් පාවිච්චිය සඳහා සූදානම් තත්වයට ගෙන ආ දිනයේ සිට ක්ෂය කිරීම් ආරම්භ කල යුතු වුවත්, ගොඩනැගිලි සඳහා ක්ෂය කිරීමේදී ඉදිකිරීම් නිම කල දිනය නොසලකා මුළු වර්ෂය සඳහාම ක්ෂය කරන ආකාරයට ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.22.921.312 ක් වූ මෝටර් වාහන 19 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතී. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 73 වන වගන්තිය ප්‍රකාර දේපල, පිරියත සහ උපකරණවලට අදාලව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සමුච්චිත ක්ෂය, වර්ෂයට අදාල ක්ෂය සහ අපහරණය කරන ලද වත්කම් වල ක්ෂයවීම හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

(i) ප්‍රමිතයේ 57 වන වගන්තිය ප්‍රකාරව සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් සියළුම ප්‍රමාණාත්මක පශ්චාත් සේවක ප්‍රතිලාභ මැනීම(Actuarial Valuation Method) පිළිබඳ තක්සේරුවක් සිදුකල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතය ප්‍රකාරව සේවක ප්‍රතිලාභ පිළිබඳව හෙළිදරව් කළ යුතු තොරතුරු නිසි පරිදි හෙළිදරව් කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂවල මුළු වටිනාකම රු.16,412,780 ක් වන අතර ඉන් වසර 05 කට වැඩි ශේෂවල එකතුව රු.8,929,887 ක් හා වසර 3 – 5 ත් අතර ශේෂවල එකතුව රු.600,000 ක් විය.

(ආ) ලැබිය යුතු ගිණුම් වල එකතුව රු.22,523,199 ක් වූ අතර ඉන් රු.13,230,715 ක් වර්ෂ 03 කට වඩා වැඩි ශේෂයක් වූ අතර වර්ෂ 1-3 ත් අතර ශේෂයන්හි වටිනාකම රු.5,896,600 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට විගණන ගාස්තු වෙන් කිරීමේ ගිණුමේ රු.1,499,709 ක ශේෂයක් පැවතියද 2010 වර්ෂයෙන් පසුව විගණන ගාස්තු ගෙවීම් කර නොතිබුණි.

(ඈ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාවට අයත් විධිමත් ගිවිසුමකින් තොරව භුක්ති විදින ඉඩම් සඳහා බදු මුදල් ගෙවා නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | 2011/2012, 2012/2013, 2013/2014, 2014/2015 හා 2015/2016 තක්සේරු වර්ෂවල ආදායම් බදු ප්‍රකාශන සකස් කිරීමට හෝ ආදායම් බදු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | තොග සහ සිල්ලර භාණ්ඩ සපයන හා භාණ්ඩ නිෂ්පාදන කරනු ලබන ආයතනයක් වන විටදී සහ කාර්තුවක පිරිවැටුම රු. මිලියන 3.75 කට වැඩි හෝ වාර්ෂික පිරිවැටුම රු. මිලියන 15 කට වැඩි වන විටදී එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි වියයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 | කොණ්ඩච්චි වතුයායේ අක්කරය රු.13,500 බැගින් අක්කර 100 ක් කැලෑ එළිකිරීම සඳහා රු.1,350,000 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණ ද කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. එම කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කිරීමට අපොහොසත්වී තිබුණු බැවින් පසුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව 2016 අගෝස්තු 30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත වෙනත් පාර්ශවයකට එම කාර්ය ලබා දී තිබුණි. අක්කරයක් රු.15,000 බැගින් අක්කර 100 ක් සඳහා රු.1,500,000 ක් 2017 අප්‍රේල් 30 දින වන විට ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වලින් රු.36,525,411 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 47,728,042 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ඌණතාවය රු.11,202,630 ක අඩුවීමක් නිරීක්ෂණය විය. වාණිජ අංශයේ ආදායම රු.19,609,086 කින් වැඩිවීම හා සේවා මධ්‍යස්ථානයේ වියදම රු.3,406,450 කින් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2012 වර්ෂයේදී රු.44,233,832 ක ශුද්ධ ලාභයක් වුවද, එය අඛණ්ඩව පිරිහෙමින් 2015 වර්ෂයේදී ශුද්ධ අලාභය රු.47,728,042 ක් විය. 2016 වර්ෂයේදී මෙහෙයුම් ආදායමක් නොවන ඉඩම් වන්දි මුදල හා පාරිතෝෂික අධි වෙන්කිරීම්වල එකතුව රු.22,746,506 ක ගැලපීම නිසා 2016 වර්ෂයේ දී ශුද්ධ අලාභය රු. 36,525,411 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේදී රු.121,065,660 ක් වූ සංස්ථාවේ දායකත්වය 2016 වර්ෂයේදී රු.87,183,875 වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනත අනුව සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ කජු වගා කිරීම හා නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම සහ මිළදී ගැනීම, අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම, විමර්ෂණය හා පර්යේෂණ කටයුතු කිරීම, අලෙවි කිරීම පිළිබඳ හා වෙනත් තොරතුරු රැස්කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම හා බෙදාහැරීම, කජු ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා අවශ්‍ය නැනැත්තන් පුහුණු කිරීම හා ලෝක වෙළඳපොළ සඳහා නිෂ්පාදනයට ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම වේ.

එකී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සංස්ථාව විසින් කප්පු වතු 07 ක්ද, අභිජනන මධ්‍යස්ථාන 04 ක්ද, බද්ධ පැල නිෂ්පාදනය කරන මධ්‍යම පැල තවාන් 07 ක්ද, කප්පු පිරිසැකසුම් මධ්‍යස්ථාන 02 ක්ද, විකුණුම් මධ්‍යස්ථාන 03 ක්ද, පර්යේෂණ මධ්‍යස්ථාන 02 ක් හා අලෙවි නියෝජිත 51 ක ජාලයකින් සමන්විත වන අතර සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) සංස්ථාව සතු කප්පු වතු වල නිෂ්පාදනය

---

විගණනය වෙත ලබාදුන් තොරතුරු මත සංස්ථාව සතු කප්පු වතු වල නිෂ්පාදනය හා වගා ප්‍රමාණය පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අක්කර 6.000 ක භූමි ප්‍රමාණයකින් සමන්විත කොණ්ඩච්චි වතුයාය නැවත වගා කිරීම 2014 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර 2017 මාර්තු වන විට අක්කර 450 ක කප්පු පැල වගාකර තිබුණි. එසේවුවද වගාව නිසි පරිදි නඩත්තු කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ වගා කල කප්පු පැල 2017 වර්ෂයේදී අස්වැන්න නෙලා ගැනීමට හැකිවන බව නිරීක්ෂණය වූ අතර එම අස්වනු විධිමත්ව ගබඩා කිරීම සහ නෙලා ගත් පසු අස්වැන්න වියළා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා නොතිබුණි.

(iii) කොණ්ඩච්චි වතුයායේ අක්කර 4.350 ක සාරවත් භූමිය නිෂ්කාර්යව පැවති අතර විධිමත් සැලැස්මක් යටතේ අවශ්‍ය උපකරණ අධීක්ෂණ නිලධාරීන් හා කම්කරුවන් ප්‍රමාණය වැඩිකර නැවත වගාකිරීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(iv) පුත්තලම ආච්චිගේ වතුයායේ අක්කර 960 භූමි ප්‍රමාණයකින් අක්කර 760 ක් වගාවට යෝග්‍ය වන අතර සමාලෝචිත වර්ෂය තුල කප්පු ක්ෂේත්‍ර බර කිලෝ ග්‍රෑම් 14.641 ක අවම ඵලදාවක් ලැබී තිබුණි. නව වගාව සඳහා අක්කර 87 ක් යොදාගෙන තිබූ අතර අක්කර 673 ක භූමි ප්‍රමාණයක් තුල වගා කල හැකි බද්ධ කප්පු පැල ප්‍රමාණය 53.840 ක් වුවත් දැනට වගා කර තිබෙන කප්පු ගස් ප්‍රමාණය 3.286 ක් පමණක් බැවින් 50.540 ක කප්පු පැල වගාකල හැකි භූමි ප්‍රමාණයක් වගාව සඳහා යොදාගැනීමෙන් තොරව නිෂ්කාර්යව තිබුණි.

(v) පුත්තලම : කමන්දළුව සහ හාඩි වතුවල කප්‍රු ගස් 15,195 ක ප්‍රමාණයක් අවුරුදු 30 ට වැඩි ආයු කාලයක් පසු කර තිබූ බැවින් ඒවායේ ඵලදාව අඩු මට්ටමක පැවතුණි. වැඩිම ඵලදාව වූ එළුවන්කුලම වතුයායේ ක්ෂේත්‍ර බර කිලෝ ග්‍රෑම් 4.93 ට සාපේක්ෂව මාන්කර්නි, සුදුවතුරආර හා ඔයාමඩුව වතු වල කප්‍රු ගසක ඵලදාව කිලෝ ග්‍රෑම් 02 කටත් වඩා අඩු වී තිබුණි.

(vi) 2012 හා 2013 වර්ෂ වල පුත්තලම වතු යායේ බීජ කප්‍රු පැල 800 ක් හා බද්ධ කප්‍රු පැල 4000 ක් වගාකර තිබුණු අතර 2015 සංගණනය අනුව සියයට 28 ක කප්‍රු පැල ප්‍රමාණයක් විනාශවී තිබුණි.

(ආ) සංස්ථාව සතු කප්‍රු වතු වල කප්‍රු ගස් හඳුනා ගෙන විධිමත් සංඛ්‍යා ලේඛන වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි

(ඇ) **සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

--------------------------------------------

කප්‍රු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් දිවයින පුරා කප්‍රු වගා සහනාධාර වැඩසටහන 2000 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට බද්ධ කප්‍රු පැල 2,383,620 ක් හා බීජ කප්‍රු පැල 1,200,640 ක් ලෙස මුළු කප්‍රු පැල 3,584,260 ක් සහනාධාර ක්‍රමය යටතේ ගොවීන්ට ලබාදී තිබුණු අතර මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂ 05 තුල ප්‍රාග්ධන වියදම් ලෙස රු. මිලියන 62.9 ක් හා පුනරාවර්තන වියදම් ලෙස රු. මිලියන 222 ක් මේ සඳහා වැය කර තිබුණි. 2013 වර්ෂයට පෙර පොහොර සහනාධාර සඳහා මුදල් ලබාදී තිබුණු අතර 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පොහොර සහනාධාර ලෙස රු. මිලියන 16 ක් ලබාදී තිබුණද සංස්ථාව විසින් සාර්ථකත්වය පිළිබඳ පසුවිපරම් සිදුකර නොතිබුණි.

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක ගොවීන් 275 ක් සඳහා 2014 වර්ෂයේ කප්‍රු පැල 34,240 ක් බෙදා දී තිබූ අතර පළමු පරීක්ෂාව සිදුකළ අවස්ථාවේ සියයට 46 ක් හා දෙවන අවස්ථාව සිදුකිරීමේදී එම පැල වලින් සියයට 65 ක් විනාශ වී තිබුණි. 2015 වර්ෂයේ එම දිස්ත්‍රික්කයේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක ගොවීන්

201 දෙනෙකු සඳහා කජු පැල බෙදා දී තිබූ අතර 2016 වර්ෂයේ දී සිදුකළ පළමු සංගණනයේදී සියයට 31 ක් විනාශ වී තිබුණි.

(iii) 2014 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක ගොවීන් සඳහා කජු පැල 36,000 ක් බෙදා දී තිබූ අතර පළමු පරීක්ෂාව සිදුකරන අවස්ථාවේදී එම පැල වලින් සියයට 58 ක් හා දෙවන පරීක්ෂාව සිදුකරන අවස්ථාව වන විට එම පැල වලින් සියයට 71 ක් විනාශ වී තිබුණ අතර 2015 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක ගොවීන් 248 ක් සඳහා කජු පැල 28,000 ක් බෙදා දී තිබුණි. 2016 වර්ෂය වන විට ඉන් පැල සියයට 43ක් විනාශ වී තිබුණි.

(iv) 2014 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක ගොවීන් 412 ක් දෙනෙකු සඳහා පැල 32,000 ක් ලබා දී තිබූ අතර දෙවන පරීක්ෂණ අවස්ථාව වන විට ඉන් ඉතිරිව තිබුණේ පැල 9,948 ක් හෙවත් සියයට 31 ක ප්‍රමාණයක් පමණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම, ආරච්චිකට්ටුව,කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල භෞතිකව පරීක්ෂා කළ නියැදියට අනුව නිරීක්ෂණය කළ කරුණු පහත දැක්වේ.

(i) ගොවීන් තිදෙනෙකුට ලබාදුන් පැල 640 ම විනාශ වී තිබුණ අතර, ගොවීන් 28 කට ලබාදුන් පැල 3,120 කින් සාර්ථක පැල ප්‍රමාණය 824 ක් හෙවත් සියයට 26 ක් විය.

(ii) බොහොමයක් කජු වතු කැලෑ වැවී තිබූ අතර නිසිපරිදි නඩත්තු කටයුතු සිදුකර නොතිබුණි. තවද සතුන්ගෙන් වන හානි වැළැක්වීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2012 වර්ෂයේ ලබාදුන් කජු පැල වලට මේ වන විට වසර 05 කට ආසන්න කාලයක් ගතවී තිබුණත් නිසියාකාර ඵලදාවක් ලැබෙන කිසිදු වගා බිමක් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය නොවිය.

(iv) කජු සහනාධාර වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මනා අධීක්ෂණයක් සිදුකල යුතු වුවත් කජු සංවර්ධන නිලධාරීන්ට අධීක්ෂණය පහසු වන පරිදි වගාබිම් නොතිබීම නිසා අධීක්ෂණ කටයුතු අපහසු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කජු නිෂ්පාදනයේදී කුණු, පුහු කජු කිලෝ ග්‍රෑම් 27.935 ක් වූ අතර කජු කිලෝ එකක ක්ෂේත්‍ර බරින් කුණු, පුහු සියයට 15 ක් විය යුතු වුවත් එළුවන්කුලම, කමන්දළුව සහ නාලන්දා වතු වල කුණු, පුහු ප්‍රතිශතය ලැබූ අස්වැන්නේ ක්ෂේත්‍ර බරින් සියයට 19 සිට සියයට 57 දක්වා වැඩිවී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාව කජු කිලෝ ග්‍රෑම් 30.598 ක් අලෙවි කර තිබූ අතර එයින් ලෙලි කජු කිලෝ ග්‍රෑම් 22.022 ක් හා කජු මද කිලෝ ග්‍රෑම් 7.029 ක් බාහිර පුද්ගලයින්ගෙන් මිලදී ගෙන තිබුණි. ඒ අනුව පිටතින් මිලදී ගත් කජු කිලෝ ග්‍රෑම් 11.430 ක් වූයෙන් සංස්ථාවේ වතු සමාලෝචිත වර්ෂයේ කජු කිලෝ ග්‍රෑම් 20.000 ක් වැනි ඉතා අඩු නිෂ්පාදනයක් ලබාකරගෙන තිබුණි.

(උ) පර්යේෂණ හා සංවර්ධනය

---

සමාලෝචිත වර්ෂයේ කමන්දළුව හා පුත්තලම පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා රු.4,631,970 ක් වැයකර තිබුණු අතර මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පර්යේෂණ සිදු කිරීමට පෙර පර්යේෂණ යෝජනාවලියක් ඉදිරිපත් කර අනුමත කරගත යුතු වුවත් පුත්තලම පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂණ දෙකකට පමණක් යෝජනාවලි ඉදිරිපත් කර තිබුණි.

(ii) පර්යේෂණවල ප්‍රගතිය ඇගයීම් කළ හැකි පරිදි අඛණ්ඩ හා විධිමත් ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

(අ) සංස්ථාව විසින් ගිණුම් කටයුතු සඳහා සුදුසු පරිගණක මෘදුකාංගයක් විධිමත් පරිදි භාවිතා කිරීම වෙනුවට ගිණුම් දත්ත සියල්ල ඇතුළත් කල නොහැකි මෘදුකාංගයක් භාවිතා කිරීම හේතුවෙන් පරිගණකගත ශේෂ පිරික්සුමක් සකස් කර නොතිබූ අතර ශේෂ පිරික්සුම හස්ත ක්‍රමයෙන් සකස් කර තිබුණි.

(ආ) පෞද්ගලික ආනයනකරුවන් විසින් ආනයනය කරනු ලබන ලෙලි කපු කිලෝග්‍රෑමයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත රුපියලයක් බැගින් අය කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේදී රු.2.150.000 අය කර මූල්‍ය ප්‍රකාශනවල විවිධ ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අක්කර 17.650 ක් වූ වතු 15 ක සංස්ථාව කපු වගා කර තිබුණද.එම වතුවලින් අක්කර 200 ක වත්තක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටද, අක්කර 1874 ක වතු 3 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවටද. අක්කර 15.280 ක වතු 6 ක් රජයටද , අක්කර 151 ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටද. අක්කර 135 ක් ඇල්කඩුව වැවිලි සමාගමට සහ අක්කර 10 ක් පශු සම්පත් මණ්ඩලයට අයත් ඒවා වන අතර එම ඉඩම් සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නැදගමුව හා පුත්තලම කපු පිරිසැකසුම් මධ්‍යස්ථානවල ලෙලි කපු තැම්බීමට යොදාගන්නා බොයිලේරුව හා ඒ ආශ්‍රිත උපකරණද පිළිවෙලින් වසරකට හා වසර 10 කට වැඩි කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි. මේ හේතුවෙන් ලෙලි කපු කැපීමේදී අපතේ යාම වැඩි වී තිබුණි.

(ආ) නැදගමුව කපු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ භාවිතයට ගතහැකිව පවතින මෝටර් සයිකල් 16 ක් නිෂ්ක්‍රියව පැවති අතර ඒවා සංස්ථාවේ කටයුතු සඳහා භාවිතයට නොගනී නම් විධිමත් පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) කොණ්ඩච්චි වතුයායේ, වතු අධිකාරින්ගේ බංගලා. ගබඩා භාරකරුවන් හා කම්කරුවන්ගේ ගොඩනැගිලි 328 ක් සහ පාසල ඇතුළු ගොඩනැගිලි විනාශ වී තිබූ අතර එහි වාහන සේවා ස්ථානයක්. ලීටර් 20.000 ජල ටැංකි 03 ක් හා වගා ළිං 01 ක් ද පවතී.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 224 ක් වුවත් තත්‍ය කාර්ය මණ්ඩලය 184 ක් වූයෙන් පුරප්පාඩු 40 ක් පැවතුණි. කම්කරු අධීක්ෂණ තනතුරු සඳහා අනුමත ප්‍රමාණය ඉක්මවා දෙදෙනෙකු බඳවාගෙන තිබුණු අතර කොන්ත්‍රාත් පදනමෙන් සේවකයින් 09 දෙනෙක් බඳවා ගෙන තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අලෙවි ප්‍රවර්ධන නිලධාරියෙකු 2016 ඔක්තෝබර් 28 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත බඳවා ගෙන තිබුණි.

(ඇ) සංස්ථාවේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙක් බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් වලට පටහැනිව බඳවාගෙන තිබුණි.

05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

සංස්ථාවේ 2014 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණු අතර 2016 වර්ෂය සඳහා 2002 මැයි 24 දිනැති අංක PF/PE/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

----------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය හා තත්‍ය සංඛ්‍යා සැසඳීමේදී අයිතම 17 කට අදාළව සියයට 14 සිට සියයට 765 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයා වෙත යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) කාර්යමණ්ඩල පරිපාලනය | කජු වගාව සඳහා යොදා ඇති කාර්යය මණ්ඩලයට සාපේක්ෂව වැඩි කාර්යය මණ්ඩලයක් ව්‍යාප්ති අංශයට යොදවා තිබුනද අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබීම. |
| (ආ) වත්කම් පාලනය | (i) කජු වතුවල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | (ii) සංස්ථාව සතු කජු වතු වලින් උපරිම ඵලදායිතාවයක් ලබාගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) තොග පාලනය | නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය බාහිර අංශ වලින් මිලදී ගන්නා කජු තොග විධිමත් ලේඛනයක සටහන් කර නොතිබීම. |
| (ඈ) ගිණුම්කරණය | (i) ගිණුම්කරණය සඳහා භාවිතා කරන මෘදුකාංග පද්ධතිය සංස්ථාවට ගැළපෙන පරිදි යාවත් කාලීන කර නොතිබීම. |

(ii) ඒකාබද්ධ ශේෂ පිරික්සුමක් පිළියෙල නොකිරීම.

(iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැරවීම.

(ඉ) ණයගැති පාලනය

සංස්ථාවේ කපු පැල අලෙවියෙන් ලැබිය යුතු ණය මුදල් එම කාලවකවානුව තුල අයකර ගැනීමට කටයුතුකර නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් සංස්ථා පාර්ශවයෙන් අදහස් දැක්වීම් හා ගනු ලබන ක්‍රියාමාර්ග

2.2.1 (අ) මෙහි සඳහන් හෙළිදරව්කිරීම් ප්‍රවර්තන වර්ෂයේ සිට අදාල පරිදි වාර්ෂික ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.1 (ආ) (i) ප්‍රවර්තන වර්ෂයේදී මේ හා සම්බන්ධ හෙළිදරව් කිරිම් වාර්ෂික ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

2.2.1 (ආ) (ii) මෙම විගණන ජේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වන හෙළිදරව්කිරීම් ප්‍රවර්තන වර්ෂයේ සිට අදාල පරිදි වාර්ෂික ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.1 (ආ) (iii)මෙය ඉදිරිපත් කිරීමේ දෝෂයක් (Presentation Error) පමණක් වන අතර, සංස්ථාවේ මෙහෙයුම් හෝ මූල්‍ය ප්‍රතිඵලයට මෙමඟින් කිසිදු බලපෑමක් එල්ල නොවේ. ඉදිරියේදී මෙම විගණන ජේදයේ සඳහන් පරිදි අදායම් හා වියදම් හිලව් නොකොට ඒවා වෙන වෙනම ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.1 (ඇ) පිරිසැකසුම්කරණය හා අගය එකතු කිරීම සංකීර්ණ කාර්ය පරිපාටියක් වන අතර, ඊට ගැළපෙන පරිදි පිරිවැය ගණනය කිරීම සඳහා වරලත් ගණකාධිකාරී ආයතනයක සේවය ලබාගෙන ඇත. එසේම, වෙළඳපොළ තරඟකාරීත්වයට අනුව නිෂ්පාදනවල විකුණුම් මිල තීරණය කර ඇති අතර අවසාන වශයෙන් සමස්ත විකුණුම් තුළින් ලාභයක් උපයා ගැනීමට එමඟින් අපේක්ෂා කර ඇත. ඒ අනුව, කජු අලෙවිය මඟින් 2016 වර්ෂයේදී රු.මිලියන 6.954 ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇත.

2.2.1 (ඇ) (i) ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සංස්ථාවේ දේපල, පිරියත හා උපකරණ ක්ෂය ප්‍රතිපත්තිය සකස් කර ඇති පරිදි ඒ අනුව නිසි පරිදි සියලු දේපල, පිරියත හා උපකරණවල ක්ෂයවීම් ගණනය කර ගිණුම්ගත කර ඇත.

2.2.1 (ඇ) (ii) ඵලදායී ජීවිත කාලය පිළිබඳ අවධානය යොමු කරනු ලදුව මේ වනවිට තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගනිමින් සංස්ථාවේ වාහන සංචිතයේ ප්‍රත්‍යාගණන කටයුතු ආරම්භ කර ඇති අතර, දැනටමත් ප්‍රත්‍යාගණන කටයුතුවලින් කොටසක් අවසාන කර අදාල වාර්තා ලැබී ඇත. වාහනවල ඉතිරි ප්‍රත්‍යාගණන කටයුතු අවසාන කළ වහාම එම ප්‍රත්‍යාගණන අගයන් ගිණුම්පොත්වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.1 (ඇ) (iii) වාර්ෂික ගිණුම්වලට සම්බන්ධ කරන ලද ගිණුම් සටහන් අංක 01 යටතේ 2016 ගිණුම් වර්ෂයේ අවසාන දිනට දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය වටිනාකම පමණක් සඳහන් කර ඇතත්, සංස්ථාවේ සියලු පිරිවැය මධ්‍යස්ථානයන් සඳහා වෙන වෙනම පිළියෙල කර ඇති දේපල, පිරියත හා උපකරණවල උපලේඛන මඟින් සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සමුච්චිත ක්ෂය, සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය හා අපහරණය කරන ලද වත්කම්වල ක්ෂය යන තොරතුරු හෙළිදරව් කර ඇත.

2.2.1 (ඉ)(i)(ii) මෙම සේවක ප්‍රතිලාභ මැනීමේ කටයුතු සඳහා බාහිර විශේෂඥයෙකුගේ සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රායෝගික දුෂ්කරතා පවතින අතර, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ දුෂ්කරතාවයක් ද පවතී. ඒ අනුව හැකි උපරිම ආකාරයෙන් අදාල තොරතුරු රැස් කරගනිමින් මෙම සේවක ප්‍රතිලාභ සම්බන්ධ මැනීම් සිදුකර ඒවා ගිණුම් පොත්වලට සම්බන්ධ කර ඇත. කෙසේ නමුත් ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන සපයාගත හැකි වූ වහාම මේ සම්බන්ධයෙන් බාහිර විශේෂඥයෙකුගේ සේවය ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (අ) මෙහි සඳහන් ගෙවිය යුතු ගිණුම් ශේෂ, ගෙවීම් කිරීමට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිකම හේතුකොටගෙන ගිණුම්පොත්වල ඉදිරියට ගෙන එන ශේෂයන් වේ. ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන ලද වහාම මෙම වගකීම් පියවීමට කටයුතු කරනු ලැබේ.

2.3 (ආ) මෙම විගණන ඡේදයේ සඳහන් වර්ෂ 03 කට වඩා වැඩි කාලසීමාවක් තිස්සේ අයකරවා ගැනීමට නොහැකි වී ඇති රු. 13,230,715/00 ක ණයගැති වටිනාකමෙන් රු. 12,389,497/00 ක්ම (ප්‍රතිශතයක් වශයෙන් ගත්කල 93.64% කි.) මෙම සංස්ථාවේ කජු පැළ විකිණීම් සඳහා විවිධ රජයේ ආයතනවලින් ලැබීමට ඇති ණය මුදල්වලින් සමන්විත වේ. මෙම කජු පැළ විකිණීම් සඳහා ලැබිය යුතු මුදල් අයකරවා ගැනීමට දීර්ඝකාලයක් තිස්සේ සිහිකැඳවීම් සිදුකරමින් දැඩි උත්සාහයක් ගනු ලැබුව ද එය

ව්‍යර්ථ වී ඇත. එසේම ඉහත සඳහන් රු.13,230,715/00 ක ණයගැති වටිනාකම තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.775,133/99 රඳවා ගැනීමේ බදු මුදල් ද ඇතුලත් වී ඇත. (ප්‍රතිශතයක් වශයෙන් ගත්කල 5.85% කි) මෙම රඳවා ගැනීමේ බදු මුදල් ද නැවත අයකරවා ගැනීම සඳහා සාකච්ඡාවන් පවත්වා ඇති නමුත් මෙතෙක් එම මුදල් අයකරවා ගැනීමට නොහැකි වී ඇත.

2.3 (ඇ) මීට පෙර ද සඳහන් කළ පරිදි මෙම ගෙවිය යුතු ගිණුම් ශේෂය ද ගෙවීම් කිරීමට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිකම හේතුකොටගෙන ගිණුම්පොත්වල ඉදිරියට ගෙන එන ශේෂයකි. මුදල් ප්‍රතිපාදන ලද වහාම මෙම වගකීම ද පියවීමට කටයුතු කරනු ලැබේ.

2.2.1 (ඈ) සංස්ථාවේ පුත්තලම ආච්චිගේවත්ත වතුයාය සඳහා අදාල බදු මුදල් ගෙවන ලෙසට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් සිදුකරන ලද ලිඛිත දැනුම්දීමට අනුව 2016 වර්ෂය දක්වාම අදාල බදු මුදල් ගෙවා ඇත. වෙනයම් බදු වගකීම් පිළිබඳ ලිඛිත දැනුම්දීම් සිදුකර නොමැත.

2.4 (අ) මේ වනවිට මෙහි සඳහන් තක්සේරු වර්ෂ 05 ටම අදාල ආදායම් බදු ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන්නාවූ තොරතුරු බදු උපදේශක ආයතනයකට භාරදී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.

2.4 (ආ) මුළුමනින්ම කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතුවලට සම්බන්ධ සංස්ථාවක් වන ශ්‍රී ලංකා කජු සංස්ථාව එකතුකළ වටිනාකම මත බදු වගකීමෙන් සහ ජාතිය ගොඩනැඟීමේ බදු වගකීමෙන් නිදහස් කරදෙන ලෙසට සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයට අනුව විගණකාධිපතිතුමාට ද පිටපත් සහිතව විස්තරාත්මක ලිපියක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා ඇති අතර, දෙවනුව ඒ සම්බන්ධයෙන් සිහිකැඳවීම් ලිපියක් ද යවා ඇත.

අදාල ලිපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නීති පිළිබඳ අර්ථ නිරූපන කමිටුව වෙත ලැබුනු බව එම දෙපාර්තමේන්තුව මඟින් මෙම සංස්ථාව වෙත ලිඛිතව දැනුම් දී ඇතත් ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණය පිළිබඳව මෙතෙක් දැනුම් දී නොමැත.

2.4 (ඇ) පළමු කොන්ත්‍රාත්කරුගෙන් පසුව තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් සංස්ථාව මඟින් ඔහු වෙත පවරන ලද කාර්යය සාර්ථකව ඉටු කිරීම නිසා මේ සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැඟී නොමැත. කෙසේ නමුත් මින් ඉදිරියට ප්‍රසම්පාදන කටයුතුවලදී අදාල ආකෘතියට අනුකූලව ලංසුකරුවන්ගෙන් කාර්ය සාධන සුරක්ෂණයන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

අදාල කොන්ත්‍රාත්කරු වෙත අවසන් ගෙවීම් කිසිවක් මේ දක්වා සිදුකර නොමැති අතර, කොන්ත්‍රාත්කරු විසින් කැළය එළි කරන ලද අක්කර 100 ක භූමිභාගය සඳහා ගිවිසුම්ගත මුදලින් 75% ක් ද, කැළය එළි කර ඇති ඉතිරි අක්කර 50 ක භූමි භාගය සඳහා ගිවිසුම්ගත මුදලින් 50% ක් ද වශයෙන් අත්තිකාරම් මුදල් ගෙවීම පමණක් දැනට සිදුකර ඇත.

මෙම කාර්යය සිදුකිරීමේදී අදාල භූමි භාගයේ බිම් බෝම්බ කිහිපයක් පිපිරී ඇති අතර, මේ සම්බන්ධයෙන් යුධ හමුදාවේ බෝම්බ නිෂ්ක්‍රීය අංශයට දැනුම් දීමෙන් පසු අදාල පරීක්ෂා කිරීම් සිදුකර අක්කර 120 ක පමණ භූමි ප්‍රමාණයක බිම් බෝම්බ නොමැති බව දන්වා ඇත.

මේ අනුව ඉතිරි අක්කර ප්‍රමාණය පරීක්ෂා කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වන හෙයින්ජ් සඳහා පත්කරන ලද කමිටුවක් මඟින් මුලික පරීක්ෂාවක් සිදුකර ලබාදුන් නිර්දේශයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ද අනුමැතිය සහිතව ඉහත පරිදි අත්තිකාරම් මුදල් ගෙවීම් නිදහස් කර ඇත.

අදාල භූමිභාගයේ තවදුරටත් බිම් බෝම්බ තර්ජනයක් නොමැති බවට අදාල අංශ මඟින් ලිඛිතව තහවුරු කරගත් පසු විධිමත් පරිදි කමිටුවක් පත් කර එම කමිටුව මඟින් ප්‍රායෝගිකව මැනුම් කටයුතු සිදු කර අදාල පරිදි අවසාන ගෙවීම් සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

4.1 (අ) (i) සංස්ථාවට අයත් කොණ්ඩච්චි වතුයායේ 2014, 2015 හා 2016 යන වර්ෂවලදී පිළිවෙලින් අක්කර 100 ක, අක්කර 250 ක හා අක්කර 100 ක කජු වගා කටයුතු සිදුකර ඇත.

ඉහත වතුයායේ 2014 වර්ෂයේදී සිදුකරන ලද අක්කර 100 ක වගා භූමියේ කම්කරුවන් යොදා කජු පැළ වටා වල් මර්ධනය (Ring Weeding) සහ ට්‍රැක්ටර් යොදා තණකොළ කැපීම මේ වනවිට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති අතර, ඒ අනුව අස්වනු ලබා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

එසේම වතුයායේ 2015 වර්ෂයේදී වගා කරන ලද අක්කර 250 ක භූමි කොටසේ පවතින සම්පත් ප්‍රමාණය අනුව හැකි උපරිමයෙන් වල් මර්ධන කටයුතු සිදුකරගෙන යනු ලබන අතර, අස්වනු ලබා ගැනීමට නියමිත කාලසීමාවට පෙර

අනිවාර්යයෙන්ම මෙහි සඳහන් වගා භූමියේ සියලු වල්මර්ධන කටයුතු නිම කරනු ලැබේ.

එමෙන්ම 2016 වර්ෂයේදී වගා කරන ලද අක්කර 100 ක භූමිභාගයේ ඇතුලත් කොටස් (Blocks) සියල්ලේම කම්කරුවන් යොදා කජු පැළ වටා වල් මර්ධන කටයුතු මේ වනවිටත් අවසන් කර ඇති අතර, ක්ෂේත්‍රයේ වල් මර්ධන කටයුතු ඉදිරියේදී යන්ත්‍ර යොදා ගැනීම මඟින් සිදුකරනු ලැබේ.

4.1 (අ) (ii) 2014 වර්ෂයේ අවසාන භාගයේ හා 2015 වර්ෂයේ මුල් භාගයේ මෙම කජු පැල වගා කටයුතු සිදුකර ඇති අතර, මෙම වගාවනේ වාණිජ මට්ටමේ අස්වැන්නක් ලබා ගැනීමට හැකියාව පවතින්නේ 2019 - 2020 වර්ෂවලදී වේ. ඊට පෙර අස්වනු ගබඩා කිරීම සඳහා පහසුකම් හා අනෙකුත් අවශ්‍ය පහසුකම් සම්පාදනය කරනු ලැබේ.

4.1 (අ) (iii) මේ සඳහා වතුයායේ අක්කර 4000 ක භූමි ප්‍රමාණයක රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර ක්‍රමය යටතේ (Public-Private Partnership-PPP) ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

4.1 (අ) (iv) පුත්තලම ආච්චිගේවත්ත වතුයායේ සම්පූර්ණ වපසරියෙන් අක්කර 200 ක් වෙම්බු වශයෙන් පවතින නිසා එම කොටස වගාව සඳහා සුදුසු නොවේ. ඉතිරි භූමියෙන් අක්කර 70 ක නව වගාවක් සිදුකර ඇති අතර, ප්‍රවර්තන වර්ෂයේදී තවත් අක්කර 100 ක භූමි කොටසක නව වගාවක් සිදුකිරීමට සැලසුම් කර ඇත.

මීට අමතරව ප්‍රවර්තන වර්ෂය තුලදී අතුරු භෝග වගාකිරීම සඳහා බාහිර පාර්ශවයන්ට ඉඩප්‍රස්ථාව ලබාදීම තුලින් වතුයායේ තවත් අක්කර 500 ක පමණ භූමි කොටසක නව කජු වගාවක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

4.1 (අ) (v) සංස්ථාවේ එළුවන්කුලම වතුයාය ආරම්භයේ සිටම ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේදවලට අනුව පවත්වාගෙන යනු ලබන උසස් තත්ත්වයේ ප්‍රභේදවලින් යුක්ත බද්ධ කජු වගාවක් සහිත වතුයායකි. ඒ අනුව අනෙකුත් වතුයායන්ට සාපේක්ෂව එම වතුයායේ එක් කජු ගසකින් ලැබෙන ඵලදාව ඉහළ අගයක් ගනී.

4.1 (අ) (vi) පුත්තලම ආච්චිගේවත්ත වතුයායේ 2012 හා 2013 වර්ෂයන්හිදී සිදුකරන ලද සංගණනයන්ට අනුව 72% ක් සාර්ථක තත්ත්වයේ පවතින කජු වගාවෙන් , පාලනය කළ නොහැකි පාරිසරික හේතු මත කජු පැළවලින් 28% ක් විනාශ වී ඇත. එම පුරප්පාඩු වූ කජු පැළ සඳහා ප්‍රවර්තන වර්ෂයේදී නව කජු පැළ සිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.

4.1 (ආ) සංස්ථාවේ කජු වතුයායන්වල විධිමත් පරිදි සංගණනයක් සිදුකර කජු ගස් සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන යනු ලැබේ. එසේ වුව ද, ප්‍රවර්තන වර්ෂයේදී වතුයායන් හි සෑම කජු ගසක්ම අංකනය කර ඊට අදාල වාර්තා පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

4.1 (ඇ) (i)- (iv) සහ 4.1 (ඈ) (i)- (iv)

වර්තමානයේදී කජු වගාවට යෝග්‍ය යැයි සැලකෙන වියළි කාලගුණයක් සහිත දිස්ත්‍රික්ක 19 ක සංස්ථාවේ කජු වගා සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. පසුගිය වසර ගණනාවක් තුල මෙම සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කළ නමුත් වාගවන් හි ඉතිරි කජු පැළ ගණන අනුව අදාල වැඩසටහනෙහි සාර්ථකත්වය සමස්තයක් වශයෙන් ගත්කළ 35%-40%කට ආසන්න වේ. සහනාධාර වැඩසටහනෙහි සාර්ථකත්වය අඩුවීම කෙරෙහි පහත හේතු සෘජුවම බලපා ඇත.

1. නියඟය හේතුකොටගෙන අධිකව කජු පැළ මියයාමකට ලක්වීම හා කජු පැළවලට යෙදීම සඳහා ජලය සපයා ගැනීමේ දුෂ්කරතාවය.

2. ප්‍රමාණයෙන් කුඩා ඉඩම්වලට (එනම් අක්කර ½ ක වපසරියක් සහිත ඉඩම්වල සිට) සහනාධාර වැඩසටහන යටතේ කජු පැළ ලබාදීම හේතුවෙන් සහනාධාර ප්‍රතිලාභීන්ගේ උනන්දුව හීනවීම මත කල්යත්ම ඔවුන් විසින් වගාව නොසලකා හැරීම.

3. වගාව කෙරෙහි අහිතකර ලෙස බලපාන අයහපත් කාලගුණික හා පාරිසරික හේතූන්.

4. වනසතුන්ගෙන් වගාවට සිදුවන හානි

5. අනපේක්ෂිත ගිනි හානි.

6. කජු අස්වනු ලැබීමට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් කල්යත්ම සහනාධාර ප්‍රතිලාභීන්ගේ උනන්දු හීනවී කජු වගාව අතහැර දමා වෙනත් කෙටිකාලීනව අස්වනු ලැබෙන භෝග වගාවන්ට යොමුවීම.

7. වෙනත් භෝග වගාවන් සඳහා වඩා ආකර්ශනීය සහනාධාර ප්‍රතිලාභ හිමිවන හෙයින් කල්යත්ම කජු වගාව අතහැර දමා එම වැඩි සහනාධාර ප්‍රතිලාභ ලැබෙන වගාවන් සඳහා සහනාධාර ප්‍රතිලාභීන් යොමුවීම.

8. සහනාධාර ප්‍රතිලාභීන්ට පෞද්ගලික වශයෙන් බලපා ඇති වෙනත් හේතු.

ඉහත තත්ත්වය පිළිබඳව දීර්ඝ වශයෙන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ප්‍රවර්තන වර්ෂයේ සිට (එනම් 2017 වර්ෂයේ සිට) ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ස්ථාන/භූමි සඳහා මූලිකත්වය ලබාදී කජු වගා සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට 2017.03.31 දින පැවති සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී.

1. ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කඳවුරු පරිශ්‍රයන් ආශ්‍රිතව පවතින කජු වගාවට සුදුසු භූමි.

2. එළිමහන් සිර කඳවුරු ආශ්‍රිතව පවතින කජු වගාවට සුදුසු භූමි.

3. බෞද්ධ පන්සල්, කතෝලික දේවස්ථාන, හින්දු කෝවිල් සහ ඉස්ලාම් දේවස්ථාන සතුව පවතින කජු වගාවට සුදුසු භූමි.

4. රජයේ පාසැල් ආශ්‍රිතව පවතින කජු වගාවට සුදුසු භූමි.

මෙම ක්‍රමවේදය භාවිතය තුලින් කජු වගාවේ පැවැත්ම සහ වර්ධනය සඳහා අවශ්‍ය භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් ද ප්‍රමාණවත් පරිදි සපයා ගැනීම අපේක්ෂා කෙරේ.

මේ අනුව ප්‍රවර්තන වර්ෂයේදී කජු වගා සහනාධාර වැඩසටහනෙහි සමස්ත සාර්ථකත්වය 50% ක සීමාව ඉක්මවීමට ඉලක්ක කරගෙන ඇති අතර, ඉදිරි වසර කිහිපය තුලදී සහනාධාර වැඩසටහනෙන් 75% ක සීමාව ඉක්මවූ සාර්ථකත්වයක් ළඟා කර ගැනීමට ඉලක්ක කර ඇත.

4.1 (ඉ) සම්මත තත්ත්වයන් හා වියළි කාලගුණික තත්ත්වයන් යටතේ ලෙලි කජු අස්වනුවල ක්ෂේත්‍ර බර ප්‍රමාණයෙන් 15% ක් දක්වා කුණු පුහු හා තෙත බර ප්‍රතිශතය වශයෙන් ඉඩහරිනු ලබයි. එසේ වුව ද, වැසි සහිත කාලගුණික තත්ත්වයක් යටතේ පාරිසරික හේතූන් මත තෙත බර ප්‍රතිශතය සම්මතයන්ට වඩා ඉහළ අගයක් ගැනීම වැලැක්විය නොහැකි වේ. 2016 වර්ෂයේ අස්වනු එක්රැස් කරන කාලසීමාව තුලදී මුළු දිවයිනටම බලපාන සේ ඉතා ඉහළ වර්ෂාපතනයක් ලැබී ඇති අතර, මෙම දැඩි වර්ෂාවෙන් ගංවතුර තත්ත්වයන් පවා නිර්මාණය විය.

ඒ අනුව මෙම තත්ත්වය යටතේ ලෙලි කජුවල කුණු පුහු හා තෙත බර ප්‍රතිශතය, ඒවායේ සම්මත ප්‍රතිශතයන්ට වඩා ඉතා ඉහළ අගයක් ගැනීම වලක්වාගත නොහැකි වේ.

මෙම සම්මත තත්ත්වයන්ට වඩා ඉහළ තෙත බර හා කුණු පුහු ප්‍රතිශතයන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය වාර්තාකිරීම් සිදුකර ඇත.

4.1 (ඊ) 2016 වර්ෂයේදී බලපාන ලද නොයෙකුත් පාරිසරික හේතූන් මත විශේෂයෙන්ම කජු අස්වනු සමයේ පැවති අධික වර්ෂාව හේතුකොටගෙන සමස්තයක් වශයෙන් මුලු දිවයිනෙහිම කජු අස්වනු බොහෝ සෙයින් අඩුවිය. දැඩිලෙස වර්ෂාවට හසුවීම හේතුකොටගෙන ලැබුනු කජු අස්වනුවලින් ද ද්‍රව්‍යාත්මක ප්‍රමාණයක් නරක්වීම නිසා (එනම් කුණු පුහු අධික වීම නිසා) නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට හා ඇණවුම් සඳහා අඛණ්ඩව කජු මද තොග සැපයිමට සංස්ථා වතුයායන්ගෙන් ලැබුනු ලෙලි කජු තොග ප්‍රමාණවත් නොවූ හෙයින් මෙසේ බාහිර සැපයුම්කරුවන්ගෙන් ලෙලි කජු තොග මිලදී ගැනීමට සිදු විය.

එසේම ලෙලි කජු හිඟවීම මත අඛණ්ඩව නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වාගෙන යාමට නොහැකි වුවහොත් පිරිසැකසුම් මධ්‍යස්ථානයේ නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධ සේවිකාවන්ගේ රැකියා අවදානමකට පාත්‍රවන බැවින් ද , එවිට ඔවුන් වෙනත් රැකියා කරා යාමෙන් නැවත නිෂ්පාදන කටයුතු සඳහා සේවිකාවන් සොයා ගැනීම ඉතා දුෂ්කර කටයුත්තක් වන බැවින් ද පිරිසැකසුම් කටයුතු අඩාල නොවී පවත්වාගෙන යමින් සේවිකාවන් රඳවා ගැනීම අවශ්‍යවීම ද මෙසේ බාහිර සැපයුම්කරුවන්ගෙන් ලෙලි කජු තොග මිලදී ගැනීම කෙරෙහි බලපෑ තවත් සාධකයක් විය. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාවේ වතුයායන් මඟින් එක් රැස් කරගන්නා ලෙලි කජු කිලෝග්‍රෑම් 100000 කට ආසන්න ප්‍රමාණයකින් පිරිසැකසුම් කටයුතු හරහා කජු මද කිලෝ ග්‍රෑම් 20000 කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇත.

එමෙන්ම ඉහත සඳහන් කළ පරිදි ඇණවුම්වලට අවශ්‍ය කජු මද තොග සැපයීම සඳහා අවශ්‍යතාවය පරිදි ලෙලි කජු තොග මෙන්ම කජු මද තොග ද බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමට සිදුවිය.

4.1 (උ) (i), (ii)

සියලුම පර්යේෂණ යෝජනාවලි සහ පර්යේෂණ කටයුතු වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂි හා වැවිලි කළමනාකරණ පීයයේ උසස් නිලධාරීන්ගේ සහභාගීත්වය සහිතව ක්‍රියාත්මක වන සංස්ථාවේ කජු පර්යේෂණ කළමනාකරණ කමිටුව මඟින් අනුමත කර ඇති අතර, එම කමිටු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. සියලු පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය තෛමාසිකව අඛණ්ඩව හා විධිමත්ව කජු පර්යේෂණ කළමනාකරණ කමිටුව මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාවේ විගණන ජේද අංක කිරීමේ දෝෂයක් පවතින බව පෙනී යන අතර, 4.1 අංකය යටතේ දෙවරක් විගණන ජේද ඉදිරිපත් කර ඇත. වාර්තාවේ අංක සඳහන්කිරීම්වල වෙනසක් සිදුකළ නොහැකි බැවින් අදාල අංක එලෙසම යොදාගෙන පිළිතුරු වාර්තාව ඉදිරිපත් කර ඇත.

4.1 (අ) විගණන ජේදයේ සඳහන් ආකාරයට මෙම පරිගණක මෘදුකාංගය විධිමත් බලපත්‍රයක් සහිතව, ගැනුම් හා විකුණුම් ස්වයංක්‍රීයව පද්ධතියට සම්බන්ධ කර නවීකරණ/යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය වියදම් දැරීම වෙනුවෙන් ප්‍රතිපාදන ප්‍රවර්තන වර්ෂයේදී සපයා ගැනීමේ හැකියාවක් නොමැත. එබැවින් 2018 වර්ෂයේදී එම පරිගණක මෘදුකාංගයේ නවීකරණ/යාවත්කාලීන කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත.

4.1 (ආ) ලෙලි කපු ආනයන ක්‍රියාවලියේදී සංස්ථාව විසින් ඉටුකළ යුතු කාර්යභාරය සඳහා සංස්ථාව මඟින් වැයකරන කළමනාකරණ/පරිපාලන වියදම් ආවරණය කරවා ගැනීම සඳහා ආනයනකරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තුව මෙහි සඳහන් පරිදි විවිධ ආදායම් ශීර්ෂය යටතේ දක්වා ඇත.

4.2 මෙම විගණන ජේදයේ සඳහන් වතුයායන්වල/ශාක අභිජනන මධ්‍යස්ථානවල නීතිමය අයිතිය විධිමත් පරිදි සංස්ථාව වෙත ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු රේඛීය අමාත්‍යාංශය හා එක්ව මේ වනවිට සිදුකරමින් පවතී. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් ද රේඛීය අමාත්‍යාංශය හරහා දැනටමත් ඉදිරිපත් කර ඇති අතර, මෙම ඉඩම්වල නීතිමය අයිතිය ලබා ගැනීමේ කටයුතු සඳහා අනුගමනය කළයුතු ක්‍රමවේදයට අනුව ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවේ.

එසේම මේ වනවිට එළුවන්කුලම වතුයායේ නීතිමය අයිතිය සංස්තාව වෙත පවරා ගැනීමේ කටයුතු අවසාන අදියර කරා පැමිණ ඇත.

4.3 (අ) මෙම විගණන ජේදයේ සඳහන් පරිදි බොයිලේරු උපයෝගි කොටගෙන තැම්බීමකින් තොරව අව්වේ වියළා ගත් ලෙලි කපු තොග කැපීම තුලින් කිසිදු ආකාරයකින් ලෙලි කපු තොග අපතේ යාමක් සිදු නොවන බව මූලික වශයෙන් සඳහන් කළයුතු වේ.

කෙසේ නමුත් එලෙස ලෙලි කජු තොග කැපීමේදී සම්පූර්ණ මද ලැබීමේ ප්‍රතිශතයෙහි කිසියම් අඩුවීමක් සිදුවේ. මේ සඳහා බොයිලේරු භාවිතය හැර ලෙලි කජුවල ප්‍රමාණය, ක්ෂේත්‍රයේදි එම ලෙලි කජු තොගවලට බලපෑ පාරිසරික බලපෑම් වැනි වෙනත් සාධක ද බලපානු ලැබේ.

එසේම නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින බොයිලේරුවේ අලුත්වැඩියාව විශේෂිත වූ අලුත්වැඩියා කටයුත්තක් වන බැවින් නිසි වගකීමක් සහිතව එම අලුත්වැඩියා සිදුකර දෙනු ලබන සුදුසුකම්ලත් ආයතන වෙතින් මිල ගණන් ලබා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවයක් පවතී. මේ සම්බන්ධයෙන් දැනට ද අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, හැකි ඉක්මණින් අදාල අලුත්වැඩියා කටයුතු නිම කිරීමට කටයුතු කරනු ලැබේ.

එසේම මෙහි සඳහන් පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ බොයිලේරු පද්ධතිය එම පරිශ්‍රයේ ස්ථාපනය කර ඇත්තේ මීට වර්ෂ 24 කට පමණ පෙරදී වන අතර, එහි ඇතුලත තැනින් තැන දිරායාම් පැවතීම, බොයිලේරුවට ජලය ගමන්කරන නලය සම්පූර්ණයේනම දිරාගොස් තිබීම, ලෙලි කජු බොයිලේරුව වෙත ගමන් කරන පටිය සම්පූර්ණයෙන්ම දිරාගොස් තිබීම, වතුර රඳවන ටැංකිය සම්පූර්ණයෙන්ම දිරාගොස් තිබීම, විදුලි මෙහෙයුම් පද්ධතිය අක්‍රියවීම වැනි අඩුපාඩු රැසක් පවතී.

මෙම බොයිලේරු පද්ධතිය කාර්මිකයෙකු ලවා පරීක්ෂා කරවාගත් අතර, පරීක්ෂා කටයුතුවලින් පසුව අදාල කාර්මිකයා දැනුම් දී සිටියේ ඉහත සඳහන් කර ඇති පරිදි බොයිලේරුවේ සමස්ත මෙහෙයුම් පද්ධතියම අක්‍රියව පවතින බැවින් එය අලුත්වැඩියා කිරීම සඳහා වැයවන මුදල ගණන් බැලීමේදී නව බොයිලේරුවක් මිලට ගෙන ස්ථාපිත කිරීම සංස්ථාවට වඩා වාසිදායක වන බවයි.

මේ නිසා බොයිලේරුවේ වර්තමාන වටිනාකම සම්බන්ධයෙන් පිළිගත් ආයතනයකින් තක්සේරු වාර්තාවක් ලබාගෙන එය නියමිත ක්‍රමවේදයට අනුව අපහරණය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

4.3 (ආ) මෙහි සඳහන් යතුරු පැදි සියල්ලම සංස්ථාවේ බාහිර කාර්යාලවලින් අපහරණ කටයුතු සඳහා විටින් විට නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය වෙත ලැබුනු ඒවා වන අතර, එම යතුරුපැදි ඉතාමත් සුරක්ෂිතව අව්වැසිවලින් හානියක් නොවන පරිදි පිරිසැකසුම් මධ්‍යස්ථාන භූමිය තුල ගාල්කර ඇත.

පිරිසැකසුම් මධ්‍යස්ථානය වෙත මෙසේ අපහරණ කටයුතු සඳහා මීට පෙර ලද යතුරු පැදි අලෙවි කර ඇති අතර, ඉතාමත් අබලන් තත්ත්වයේ පැවති හෙයින් අලෙවි කර ගැනීමට නොහැකි වූ යතුරු පැදි 02 ක් හැර (එනම් අංක 144-3134 හා 144-3141 දරණ යතුරු පැදි) විගණන විමසුමේ සඳහන් යතුරු පැදි 16 න් 14 ක්ම ලැබී ඇත්තේ එම අලෙවි කිරීමේ කටයුත්තට පසුවයි.

පෙර සඳහන් කළ යතුරු පැදි 14 න් බොහොමයක් පසුගිය වර්ෂයේ, එනම් 2016 වර්ෂයේ මැද හා අගභාගවලදී ලැබී ඇති අතර, සාමාන්‍යයෙන් යතුරු පැදි අපහරණ කටයුතු සිදුකරන ලබන්නේ ටෙන්ඩර් කටයුතු සිදුකිරීම සඳහා ප්‍රමාණවත් යතුරු පැදි සංඛ්‍යාවක් එකතු වූ පසුවයි. ඒ අනුව දැනට එකතු වී ඇති එම යතුරු පැදි අපහරණය කිරීමේ කටයුතු ඉදිරියේදී නිම කරනු ලැබේ.

4.3 (ඇ) ත්‍රස්තවාදී කටයුතුවලින් විනාශ වූ එක් ගොඩනැගිල්ලක් අලුත් වැඩියා කර වර්තමානයේදී භාවිතා කරනු ලබන අතර, තවත් ගොඩනැගිලි 02 ක අලුත්වැඩියා කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත.

ඉදිරියේදී පවතින මුදල් ප්‍රතිපාදනවලට අනුව සහ වතුයායේ භූමිය සංවර්ධනය කිරීම තුලින් පැනනඟින්නා වූ අවශ්‍යතාවයන්ට අනුව අනෙකුත් ගොඩනැගිලි ද ක්‍රමානුකූලව පියවරෙන් පියවර අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

4.4 (අ) වතුයායන්වල කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය හේතූන් මත මෙම විගණන ඡේදයේ සඳහන් පරිදි කම්කරු අධීක්ෂණ තනතුරු සඳහා දෙදෙනෙකු බඳවාගෙන ඇති අතර, එම තනතුරු සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලුම් කර ඇත.

4.4 (ආ) විධිමත් විනය පරීක්ෂණයකින් විනය විරෝධී කටයුතු කිහිපයක් ඔප්පුවීම මත අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව 2015.04.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි එවකට සංස්ථාවේ හිටපු අලෙවි කළමනාකරුව අලෙවි ප්‍රවර්ධන නිලධාරී තනතුරට නිල තත්ත්වයෙන් පහත හෙලන ලදී. නීතිමය ක්‍රියාමාර්ගයකට ප්‍රවේශවීම නිසා ඉහත දිනයේ සිට එම හිටපු අලෙවි කළමනාකරු සේවයට වාර්තා නොකරන ලද බැවින් එදින පටන් අලෙවි ප්‍රවර්ධන නිලධාරී තනතුර හිස්ව පැවතිණි. පසුව රාජකාරී අවශ්‍යතාවය මත විධිමත් පරිදි පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණයකින් අලෙවි ප්‍රවර්ධන නිලධාරී තනතුරට ජ්‍යෙෂ්ඨ නිලධාරිණියක බඳවාගත් අතර, සංස්ථාවේ අලෙවි

ප්‍රවර්ධන කටයුතුවල අවශ්‍යතාවය සලකා බලා අතිරේක අලෙවි ප්‍රවර්ධන නිලධාරී තනතුරක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලුම් කර ඇත.

4.4 (ඇ) වර්තමානයේදී සංස්ථාවේ සියලුම විධායක නිලධාරීන්, අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධානවලට අනුව අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇත.

5.1 2014 හා 2015 වර්ෂයන් සඳහා පිළියෙල කරන ලද වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත භාරදී ඇත. එම අනුමැතිය ලද වහාම අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

5.2 අයවැය ලේඛනය සඳහන් ඇස්තමේන්තුගත ආදායම් සහ වියදම් සමඟ සත්‍ය ආදායම් සහ වියදම් විධිමත්ව සංසන්දනය කරමින් වැය පාලන කටයුතු සිදුකෙරේ.

6 (අ)-(ඉ) මෙහි සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් හි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් විස්තරාත්මක අදහස් දැක්වීම් හා ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව මෙම වාර්තාවේ දක්වා ඇති අතර, ඉදිරියේදි මෙම පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා කජු සංස්ථාව

**වර්ෂ 05 ක ගිණුම් සාරාංශය**

| | 2016 (රු.) | 2015 (රු.) | 2014 (රු.) | 2013 (රු.) | 2012 (රු.) |
|---|---|---|---|---|---|
| ලාභාලාභ ගිණුම | | | | | |
| ශුද්ධ විකුණුම් | 94,906 | 75,297 | 115,370 | 134,180 | 150,107 |
| විකුණුම් පිරිවැය | (68,648) | (55,055) | (62,376) | (82,586) | (59,939) |
| **දළ ලාභය** | **26,258** | **20,242** | **52,994** | **51,594** | **90,168** |
| අනෙකුත් ආදායම් | 28,224 | 13,974 | 4,219 | 10,494 | 1,846 |
| පුනරාවර්තන ප්‍රදාන | 16,923 | 27,798 | 21,235 | 22,775 | 25,910 |
| පරිපාලන වියදම් | (39,141) | (44,001) | (53,396) | (43,493) | (44,455) |
| ක්‍රමක්ෂය | (634) | (992) | (3,283) | (3,045) | (3,715) |
| **වාණිජ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය** | **31,630** | **17,021** | **21,769** | **38,325** | **69,754** |
| **සේවා අංශය - ආදායම් ඉක්මවූ වියදම්** | **(68,155)** | **(64,749)** | **(47,826)** | **(37,358)** | **(25,520)** |
| **ශුද්ධ ලාභය/අලාභය** | **(36,525)** | **(47,728)** | **(26,057)** | **967** | **44,234** |
| **ශේෂ පත්‍රය** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 100,869 | 110,208 | 77,005 | 63,916 | 64,986 |
| ඵල දරණ වගා නඩත්තුව | 29,303 | 31,442 | 35,141 | 30,466 | 31,620 |
| පර්යේෂණ සහ සංවර්ධන වියදම් | - | - | 1,046 | 215 | - |
| ඵල නොදරණ වගා නඩත්තුව | 41,362 | 33,243 | 25,853 | 29,288 | 19,982 |
| අනෙකුත් කුඩා ව්‍යාපෘති | 949 | 806 | 615 | 619 | 707 |
| **මුළු ජංගම නොවන වත්කම්** | **172,483** | **175,699** | **139,660** | **124,504** | **117,295** |
| ජංගම වත්කම් | | | | | |
| තොග | 28,916 | 30,131 | 48,712 | 29,460 | 46,135 |
| වෙළඳ ණය ගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ | 20,798 | 24,411 | 24,843 | 60,042 | 70,822 |
| අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 4,841 | 4,287 | 10,080 | 5,461 | 3,374 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7,874 | 38,846 | 60,879 | 66,529 | 28,676 |
| මුළු ජංගම වත්කම් | **62,429** | **97,675** | **144,514** | **161,492** | **149,007** |
| **මුළු වත්කම්** | **234,912** | **273,374** | **284,174** | **285,996** | **266,302** |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| **මූලික ප්‍රාග්ධනය** | 40,000 | 40,000 | 40,000 | 40,000 | 40,000 |
| **රාජ්‍ය ප්‍රදාන** | 123,860 | 114,881 | 78,957 | 58,745 | 34,959 |
| **අ අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන** | 18,530 | 18,917 | 19,304 | 19,691 | 17,911 |
| **ප්‍රාග්ධන සංචිත** | 17,442 | 17,442 | 22,215 | 22,241 | 23,676 |
| **ලාභාලාභා ගිණුම** | (27,975) | 8,550 | 56,278 | 81,339 | 77,788 |
| **මුළු හිමිකම්** | **171,857** | **199,790** | **216,754** | **222,016** | **194,334** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| **පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීම්** | 40,060 | 52,471 | 42,415 | 33,875 | 31,272 |
| **වාහන කල්බදු** | - | - | - | 3,257 | 6,513 |
| **මුළු ජංගම නොවන වගකීම්** | **40,060** | **52,471** | **42,415** | **37,132** | **37,785** |
| **ජංගම වගකීම්** | | | | | |
| **වෙළඳ ණය හිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ** | 22,995 | 21,113 | 25,005 | 26,849 | 34,183 |
| **මුළු ජංගම වගකීම්** | **22,995** | **21,113** | **25,005** | **26,849** | **34,183** |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | **234,912** | **273,374** | **284,174** | **285,997** | **266,302** |
| **ශුද්ධ වත්කම් ප්‍රතිලාභය %** | (21.3) | (23.9) | (12.0) | 0.44 | 22.76 |
| **ශුද්ධ ලාභ අනුපාතය %** | (38.5) | (63.4) | (22.6) | 0.7 | 29.5 |
| **ජංගම අනුපාතය** | 2.7 | 4.6 | 5.8 | 6.0 | 4.4 |
| **ක්ෂණික වත්කම් අනුපාතය** | 1.5 | 3.2 | 3.8 | 4.9 | 3.0 |
| **මුළු ආදායමට මුළු වියදම** | 0.1 | 0.8 | 0.9 | 1.0 | 1.6 |